


බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

பௌத்த மத அலுவல்கள் திணைக்களம்

Department of Buddhist Affairs

# කාර්යසාධන වාර්තාව

## செயற்திட்ட அறிக்கை

## Performance Report

# 2017

By-BK

# දැක්ම

බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් කරා...

# මෙහෙවර ප්‍රකාශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා කර්තව්‍යයන් මැනවින් සංවිධානය කරලීම තුළින්, දේශීය හා විදේශීය බෞද්ධ ජනතාවගේ ප්‍රබෝධයට හේතු වන දැහැමි ගුණගරුක සමාජයක් බිහි කර ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කරලීම.

# අරමුණු

- ථෙරවාදී බුදු දහම ආරක්ෂා කිරීම, පෝෂණය කිරීම හා ප්‍රචලිත කිරීම.
- සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම හා ඒවා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීම.
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කරලීම.
- බුද්ධ ශාසනය හා අනාදිමත් කාලයක සිට බැඳුණු අනෙකුත් මතවාදයන් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා සංවර්ධනය කිරීම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම හා මෙහෙයවීම.

# පටුන

පිටු අංක

දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ අරමුණු 01
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය 04
හැඳින්වීම 05
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන 08
දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 09

**01.** පාලන අංශය **09 - 11**
01.1. 2016 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

**02.** විහාර දේවාලගම් අංශය **12 - 13**
02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම
02.2. බස්නායක නිලමේවරුන් පත් කිරීම
02.3. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට සහාය වීම
02.4. රත්නපුර හා මහනුවර ප්‍රාදේශීය කාර්යාල හා සම්බන්ධීකරණ කටයුතු
02.5. විහාරස්ථාන ගිණුම් වල මුදල් සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීම
02.6. පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය
02.7. විහාරස්ථාන වල පවතින ඉඩම් ආරවුල් නිරාකරණය

**03.** දහම් පාසල් අංශය **14 - 19**
03.1. දහම් පාසල් ලියාපදිංචිය
03.2. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම
03.3. දහම් පාසල් ගුරු ශිෂ්‍ය තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම
03.4. 120 වන දහම් පාසල් දිනය සැමරීම
03.5. ගුරුභවතුන් සඳහා පුස්තකාල දීමනා, නිල ඇඳුම් සහ මාසික දීමනා ලබා දීම
03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය
03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම
03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය
03.9. බුද්ධ ජයන්ති පොත් හල

**04.** සංවර්ධන අංශය **20 - 25**
04.1. සිල්මාතා කටයුතු
04.2. බෞද්ධ ලේඛකයින් දිරි ගැන්වීම සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.
04.3. දහම් පාසල් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම
04.4. විහාරස්ථාන කාර්ය සාධක සමිති හා දායක සභා ලියාපදිංචි කිරීම.
04.5. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රර්ධනය කිරීම.
04.6. ජාතික උත්සව සංවිධානය කිරීම
04.7. ආදාහන සඳහා වියදම් දැරීම.
04.8. උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීම.
04.9. සිවුපස ආධාර ලබා දීම
04.10. අක්තපත්‍ර ප්‍රදානෝත්සවය
04.11. විහාරස්ථාන සඳහා දුරකථන, විදුලිය, ජලය සහනදායී පදනම මත ලබා දීම.
04.12. කලා ශිල්ප

**05.** ව්‍යාපෘති අංශය **26 - 27**

05.1. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන

05.2. දහම් සරසවිය පාඨමාලාව

05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම

05.4. බෞද්ධ විශ්වකෝෂය

05.5. ත්‍රිපිටක පරිවර්තනය

**06.** භික්ෂු ලියාපදිංචි අංශය **28**

06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම

**07.** තොරතුරු අංශය **29 - 31**

07.1. ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික තොරතුරු ඒකරාශී කිරීම

07.2. තොරතුරු යාවත්කාලීන කිරීම

07.3. පාලි ප්‍රවර්ධන පාඨමාලාව

07.4. මාධ්‍ය කටයුතු සහ වෙනත් සේවාවන්

**08.** ගිණුම් අංශය **32 – 35**

**09.** අභ්‍යන්තර විගණන අංශය **36**

**10.** බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල **37 – 43**

10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය

10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

# බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බුද්ධ ශාසනය රැක ගැනීම, පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමේ භාරදූර රාජ්‍ය වගකීම බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එම උදාර වගකීම ඉටු කිරීම සඳහා මනා දැක්මකින් යුතුව කටයුතු කිරීමට සෑම විටම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම සතුටට කරුණකි.

අපගේ දැක්ම වනුයේ බොදු පිළිවෙත් සුරකින සමාජයක් ගොඩනැගීමයි. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ කාර්යයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. රටක සංවර්ධන ක්‍රියාවලියේ දී සිදුවන සමාජ, ආර්ථික හා භෞතික දියුණුවට සමාන්තරව ඒ රට තුළ අධ්‍යාත්මික දියුණුවක් ඇති නොවන්නේ නම් පූර්ණ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය. එබැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කෙරෙනුයේ ඉතා අගනා කාර්යභාරයකි.

එම අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම සඳහා ගමත් පන්සලත් අතර සබඳතාව ශක්තිමත් කරමින් දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමත්, මත්ද්‍රව්‍ය, මත්වතුර හා දුම්වැටි භාවිතය පිටුදැකීමත්, සාරධර්ම ප්‍රවර්ධනයත්, බෞද්ධ ඉගැන්වීම භාවිතයට හුරු කරවීමත් වෙනුවෙන් ඇප කැපව කටයුතු කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයි.

විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති නෛතික කාර්යභාරය අප්‍රමාදව ඉටුකිරීමත්, දහම් පාසල්, සංවර්ධන, ව්‍යාපෘති, තොරතුරු, පාලන, ගිණුම්, අභ්‍යන්තර විගණන හා භික්ෂු ලියාපදිංචි යන අංශ වල සේවාවන් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පර්යේෂණාත්මක නවතාවයකින් යුතුව ඉටු කිරීමට කැප වී ක්‍රියා කළ සියලු අංශ භාර මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති පූර්වක ප්‍රණාමය පුද කරමි.

**නිමල් කොටවලගෙදර**

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

# හැඳින්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාමට අදාළ කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටුකරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහාය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියළුම සාමණේර/ උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.




මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන අංශ ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත.

විහාර දේවාලගම් ආඥා පනතට අදාළ කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටුකර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශීය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.

01. ශාසනාරක්ෂක මණ්ඩල පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.

02. දහම් පාසල් කටයුතු.
    i. දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
    ii. දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
    iii. දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
    iv. දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවීම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.
    v. දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම.
    vi. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාව ලබා දීම
    vii. දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරීම.
    viii. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
    ix. දහම් පාසල් ගොඩනැගිලි සඳහා ආධාර ලබා දීම.

x. දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ බෙදා දීම.

xi. අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතික පත් ප්‍රදානය කිරීම.

xii. දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගයක් පැවැත්වීම.

xiii. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමගත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමගත් ඒකාබද්ධ ව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

03. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු, ආයතන කටයුතු, ගොඩනැගිලි නඩත්තුව, තැපැල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටු කිරීම.

04. ආයතනයේ වියහියදම් පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටු කිරීම.

05. විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන්/ භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.

06. බෞද්ධ සිද්ධස්ථාන වල දේපළ පරිපාලනයට අවශ්‍ය සහාය ලබා දීම. මෙහි දී සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සඟ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපළ වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් ඉටු කිරීම.

07. දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරාධිපති තනතුර පිළි ගැනීම.

08. විහාරස්ථාන ආධාර, සිව්පස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම.

09. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාළ කටයුතු.

10. ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම.

11. නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම.

12. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම.

13. විහාරස්ථාන සඳහා සහන ගාස්තු මත දුරකථන, ජලය, විදුලිය වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම.

14. නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු.

15. කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම.

16. නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/ කම්කරු)

17. ලේඛකාධාර යටතේ පොත්පත් මිලදී ගැනීම් කටයුතු.

18. දස සිල් මාතාවන් පිළිබඳ කටයුතු
    i. ආරාම ලියාපදිංචි කිරීම
    ii. හැඳුනුම්පත් නිකුත් කිරීම.
    iii. අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු.
    iv. රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම.

19. භික්ෂූන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා ලියාපදිංචිය.

20. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම.

21. විහාරස්ථාන සතු දේපළ හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු.

ඉහත කාර්යයන්ට අමතරව වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ හා සමස්ත ලංකා සිසු නිපුණතා තරඟය පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උලෙළ පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කළ හැකිය.

## බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



# 2017.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

| අංකය | තනතුර | වැටුප් කේත අංකය | සේවය | සේවා ශ්‍රේණිය | පන්තිය/ ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | | | සේවයේ නියුතු නිලධාරී සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | දෛනික | ස්ථිර | කොන්ත්‍රාත් | දෛනික | |
| 01 | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | SL 3-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | විශේෂ | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 02 | බෞද්ධ කටයුතු කොමසාරිස් | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | I | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 04 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 05 | නියෝජ්‍යසහකාර කොමසාරිස්/ | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 4 | 0 | 0 | 4 | 0 | 0 | 0 |
| 06 | ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 07 | නීති නිලධාරී | SL 1-2016 | දෙපාර්තමේන්තුගත | ජ්‍යෙෂ්ඨ | III | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 08 | ප්‍රධාන කර්තෘ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 09 | උප කර්තෘ | SL 1-2016 | දෙපාර්තමේන්තුගත | ජ්‍යෙෂ්ඨ | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 10 | නියෝජ්‍යසහකාර කර්තෘ/ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 0 | 2 | 0 | 0 | 0 | 0 | 2 |
| 11 | පරිපාලන නිලධාරී | MN 7-2016 | රාසේ.ස.ක. | තෘතියික | අධි | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 12 | ව්‍යාපෘති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 3 | 0 | 0 | 2 | 0 | 0 | 1 |
| 13 | බෞද්ධ කටයුතු සමායෝජක | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 480 | 0 | 0 | 426 | 0 | 0 | 54 |
| 14 | සංවර්ධන සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 38 | 0 | 0 | 26 | 0 | 0 | 12 |
| 15 | ගිණුම් සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 2 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| 16 | සහකාර නීති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 17 | සංවර්ධන නිලධාරී | MN 4-2016 | සං.නි.සේ | ද්විතියික | | 207 | 0 | 0 | 195 | 0 | 0 | 12 |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර | MN 2-2016 | රා.ක.ල.සේ. | ද්විතියික | I/ II/III | 45 | 0 | 0 | 29 | 0 | 0 | 16 |
| 19 | රියදුරු | PL 3-2016 | ඒ.රි.සේ | ප්‍රාථමික | | 12 | 0 | 0 | 10 | 0 | 0 | 2 |
| 20 | බංගලා භාරකරු | PL 2-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 21 | කාර්යාල සේවක සේවය | PL 1-2016 | කාසේ.සේ. | ප්‍රාථමික | I/ II/III | 20 | 0 | 0 | 19 | 0 | 0 | 1 |
| 22 | ලොරි සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 23 | බංගලා භාරකරු සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| එකතුව | | | | | | 825 | 3 | 0 | 720 | 0 | 0 | 108 |

# 01

# පාලන අංශය

දෙපාර්තමේන්තුව තුළ ඇති පාලන අංශය මඟින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කළ හැකිය.

- දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා ඒ හා සම්බන්ධ සියලු කටයුතු.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- වාහන නඩත්තු කිරීම ඇතුළුව වාහන විෂයයට අදාළ සියළුම රාජකාරි.
- ජල, විදුලි, දුරකථන බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- තැපැල සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- තනතුරු අනුමත කර ගැනීම, බඳවා ගැනීම, බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- නිලධාරීන්ගේ පැමිණීම, නිවාඩු ආදිය සම්බන්ධ සියළුම රාජකාරි.
- නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- අතිකාල, ගමන් වියදම් වලට අදාළ වවුචර භාර ගැනීම හා අනුමත කිරීම.
- නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.
- දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම.
- ගොඩනැඟිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය)
- මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී කළමනාකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.

## 01.1. 2017 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

1. රා.ප.ච. 03/2006 අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ වැටුප් 2017.01.01 දිනට හා 2018.01.01 දිනට පරිවර්තනය කිරීම.
2. 2017 වර්ෂය සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරන බෞද්ධ කටයුතු සමායෝජක, සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී

2.තනතුරු වලට අයත් නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම හා ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම.

3. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර පත්වීම් ප්‍රදානයෙන් පසු දිස්ත්‍රික්/ ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත කිරීම.

4.

5. 1999 හා 2005 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේ වැඩසටහන යටතේ මෙම දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලද නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.

6. දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම.

7. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සඳහා කාර්යාලීය ගමන් මළු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

8. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.

9. නීති නිලධාරී කාර්යාලය දෙවන මහලේ ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

10. මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතින බෞද්ධ විශ්වකෝෂයේ සම්පාදන කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ කර්තෘ තනතුරු 03ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය. ඒ සම්බන්ධ බඳවා ගැනීමේ කටයුතු සඳහා අයදුම්පත් කැඳවීම, ගැසට් පත්‍රයේ සහ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම හා සුදුසු පුද්ගලයන් තොරා අදාල පත්වීම් ලබාදීම.

11. දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පවත්වා ගෙන යාම, ඒවායේ අලුත්වැඩියා කටයුතු සහ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු සිදු කිරීම.

2017.12.31 දිනට දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පහත පරිදි වේ.

- ❖ වෑන් රථ - 04
- ❖ ලොරි රථ - 03
- ❖ කාර් රථ - 03
- ❖ කැබ් රථ - 02

12. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දීම සහ නිලධාරීන අග්‍රහාර රන් සහ රිදී යෝජනා ක්‍රම සඳහා ලියාපදිංචි කටයුතු සිදු කිරීම.

13. මහානායක චාරිකාරාමය කටයුතු පවත්වාගෙන යාම

14. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ආපදා ණය ලබා දීමට කටයුතු කිරීම.

15. 2016 කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කිරීම හා මුද්‍රණය කිරීම.

# 02

# විහාර දේවාලගම් අංශය

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම විහාර දේවාලගම් අංශයට පැවරී ඇති අතර එමගින් බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය හා චිරස්ථිතිය තහවුරු වී ඇත.

## 02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම.

1. විහාරස්ථාන ලියා පදිංචි කිරීම සඳහා ලැබී ඇති ඉල්ලුම් පත් සංඛ්‍යාව = 426
2. ලියාපදිංචි කර ඇති විහාරස්ථාන සංඛ්‍යාව = 381
3. මහානායක ස්වාමීන් වහන්සේලා විසින් නිකුත් කරනු ලබන විහාරධිපති ධූරය තහවුරු කිරීමේ ලිපිය පිළිගත් බව දන්වා යැවූ ලිපි සංඛ්‍යාව = 246

## 02.2. විහාරස්ථාන හා දේවාල සතු ඉඩම් බදුදීම

1. බදු අයදුම් පත් ලැබී ඇති සංඛ්‍යාව = 203
2. බදු ලබාදී ඇති සංඛ්‍යාව = 99
3. බදු මුදල් සංශෝධනය කර ඇති සංඛ්‍යාව = 10

## 02.3. අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතව තිබූ බැංකු මුදල් නිදහස් කිරීම.

1. අදාළ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් කර ඇති ප්‍රමාණය = 80
2. අදාළ ඉල්ලීම් සඳහා මුදල් නිදහස් කරන ලෙස ලබාදුන් නිර්දේශ මත නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය රුපියල් = 56,252,283.51

## 02.4. විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම්වල ගස් කැපීමට හා විකිණීමට අනුමැතිය දීම

1. ගස් කැපීමට අනුමැතිය ඉල්ලීමේ ලිපි ලැබී ඇති ප්‍රමාණය = 49
2. ගස් කැපීමට අනුමැතිය ලබාදී ඇති ප්‍රමාණය = 41

## 02.5. පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබා දීම

1. පූජා ඔප්පු ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති ප්‍රමාණය = 222
2. පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබාදී ඇති ප්‍රමාණය = 217

## 02.6. භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලිකව මිළදීගත් දේපල සඟසතු නොවන බව දැනුම් දීම

1. අදාළ ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීම් ලිපි ලැබී ඇති ප්‍රමාණය = 65
2. අදාළ දේපල සඟ සතු නොවන බව දැනුම් දී ඇති ප්‍රමාණය = 32

.

## 02.7. ආරණ්‍ය සේනාසන ඉදිකිරීමට අනුමැතිය ලබාදීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල ආරණ්‍ය සේනාසන ඉදිකිරීමට භික්ෂූන් වහන්සේලා විසින් ඉල්ලා ඇති අතර, එම ඉල්ලීම් පහත පරිදි ලැබීම් හා නිර්දේශ ලබාදීම් සිදුකර ඇත.

1. ඉල්ලීම් ලිපි ලැබී ඇති ප්‍රමාණය = 22
2. එම ඉල්ලීම් සඳහා නිර්දේශ ලබාදී ඇති ප්‍රමාණය = 13

## 02.8. භාරකාර පත්වීම් සිදුකිරීම හා සිද්ධස්ථාන සම්බන්ධ කටයුතු .

විහාර දේවාලගම් ආඥා පනතේ 4:1- වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ පාලනයේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව විහාර දේවාලගම් ආඥා පනතේ 4:1- වගන්තියෙන් පාලනය වන (ප්‍රධාන කාර්යාලය මගින්) විහාරස්ථාන /දේවාල 124 සඳහා 2017 වර්ෂයේ පහත පරිදි කටයුතු කර ඇත.

1. විහාරස්ථාන සංඛ්‍යාව = 109
2. භාරකාර ධුරයට පත් කරන ලෙස ලැබී ඇති ආකෘති පත්‍ර සංඛ්‍යාව = 24
3. භාරකාර ධුරයට පත් කර සහතික පත් නිකුත් කර ඇති සංඛ්‍යාව = 22

1. දේවාල සංඛ්‍යාව = 32
2. බස්නායක නිලමේ ධුර කාලය අවසන්වූ දේවාල සංඛ්‍යාව = 04
3. බස්නායක නිලමේ ධූරයට පත් කර ඇති සංඛ්‍යාව = 04

1. වත්කම් ලේඛන සකස් කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව = 08
   a. දේවාල සංඛ්‍යාව = 04
   b. විහාරස්ථාන සංඛ්‍යාව = 04
2. වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව = 02





1. වාර්ෂික අනුමාන අයවැය ලේඛන ලැබී ඇති සංඛ්‍යාව = 68
2. ආර්ධ වාර්ෂික අනුමාන අයවැය ලේඛන ලැබී ඇති සංඛ්‍යාව = 50
3. අනුමාන අය වැයවාර්තා අනුමත කොට නැවත යොමුකර ඇති සංඛ්‍යාව = 49
4. පඩුරු මුදල් සම්බන්ධ කටයුතු අධීක්ෂණය කර ඇති සංඛ්‍යාව = 42

මීට අමතරව අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතුව තිබූ වාහන 12 ක අයිතිය ඉල්ලා සිටි වර්තමාන විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සඳහා එම නිර්දේශ ලබාදී ඇත. මැණික් බලපත්‍ර සඳහා ලැබුනු ඉල්ලීම් 02 ක් වෙනුවෙන් නිර්දේශ ලබාදීම මෙන්ම රජය විසින් සිද්ධස්ථාන සතු ඉඩම් අත්පත් කරගැනීමේදී වන්දි ලෙස ලැබුණු මුදල් නිදහස් කරගැනීමට නිර්දේශ ලබාදී ඇත. (එම නිර්දේශ මගින් නිදහස් කර ඇති වන්දි මුදල් වටිනාකම, රුපියල් 25690352.00 කි.)

තවද සිද්ධස්ථාන සම්බන්ධ නෛතික කටයුතු වෙනුවෙන් අධිකරණයේ/ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවේ පෙනී සිටීම් 29 ක් ද, සිද්ධස්ථාන ගැටළු විසඳීමට අදාල ස්ථානීය පරීක්ෂණ 50 ක් ජංගම සේවා 39 කට සහභාගි වීම හා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම් 26 ක් සිදු කර ඇත.

# 03
# දහම් පාසල් අංශය

## 03.1. දහම් පාසල් ලියාපදිංචිය

දරුවන්ගේ සදාචාරාත්මක ගුණ දහම් වර්ධනය කිරීමට දහම් පාසල මහෝපකාරී වේ. ඒ අරමුණින් ආරම්භ කරන ලද සියලුම දහම් පාසල් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලබයි. ලියාපදිංචියෙන් අනතුරුව දහම් පාසල පවත්වාගෙන යාමට අවශ්‍ය පෙළපොත්, නාමලේඛන ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සඳහා වාර්ෂික තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබයි.

**ප්‍රස්තාරය 03.1 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය**



## 03.2. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම

දහම් පාසලෙහි ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම විභාගය පැවැත්වේ. 2017 වර්ෂයේ දී විභාග මධ්‍යස්ථාන 3361 අයදුම්කරුවන් 976,639 දෙනෙක් සඳහා ශ්‍රේණි විභාගය පවත්වන ලද අතර මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් 21,000,000 ක් වූ අතර දරන ලද වියදම රුපියල් 17,510,072 කි.

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අපේක්ෂක සංඛ්‍යාව | 716,840 | 757,927 | 765,887 | 777,576 | 787,692 | 808,161 | 813,432 | 855,868 | 950,274 | 913,720 | 976,639 |
| මධ්‍යස්ථාන සංඛ්‍යාව | 3,667 | 4,068 | 3,888 | 3,884 | 5,758 | 3,920 | 3,830 | 3,842 | 3,907 | 3,938 | 3,361 |

## 03.3. දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස්කිරීම හා පවත්වාගෙන යාම.

දිවයින පුරා ඇති දහම් පාසල් වල ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සහ ගුරුවරුන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. එමගින් දහම් පාසල් ගුරුවරුන් හා ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සැළසුම් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැළසේ.




**ප්‍රස්තාරය 03.2 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**




**ප්‍රස්තාරය 03.3 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරු සංඛ්‍යාවේ වර්ධනය**

වාර්ෂිකව දහම් පාසල් ගුරුවරුන්ගේ පුස්තකාල දීමනා සහ නිල ඇඳුම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම සහ පෙළ පොත් ලබා දීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාවන් ගණන් ගැනීම සඳහා වෙනත් වැඩසටහන් වලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම සංඛ්‍යා ලේඛන වාර්ෂිකව ලබා ගැනේ.




**2017 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 10,018 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2,169,368 කි.**

2017 වර්ෂයේ දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීමේ ආකෘති පත් 61 000 ක් මුද්‍රණය කර ඇති අතර වියදම් වූ මුදල රුපියල් 357,063.50 කි.




ප්‍රස්තාරය 03.4 - 2017 - දහම් පාසල් සංඛ්‍යාව

## 03.4. 122 වන දහම් පාසල් දිනය සැමරීම.

සමස්ත ලංකා දහම් පාසල් දිනය සැමරීමේ උත්සවය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසල ආරම්භ කළ දිනය වන 1895 අගෝස්තු මස 03 වන දින බැවින් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දිනයි. 2017 වර්ෂයට යෙදුණු 122 වැනි දහම් පාසල් දින සැමරුම් උත්සවය අගෝස්තු 03 දින වව්නියාව නගරසභා ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.

වව්නියාව දිස්ත්‍රික්කයේ සිසුන් හා ඇගයීම් වලින් ජයග්‍රහනය කරන ලද දහම් පාසල් දරුවන් වෙනුවෙන් ත්‍යාග පිරි නැමීම

දහම් පාසල් ගුරුවරුන්, දෙමව්පියන් හා දරුවන් සම්බන්ධ කරගෙන සාරධර්ම පෙරහැරක් පැවැත්වීම.

බෞද්ධ ප්‍රදර්ශන පැවැත්වීම ප්‍රදර්ශන පුවරු, ඡායාරූප, චිත්‍ර, මූර්ති, පොත් ඇතුළත්ව ප්‍රදර්ශනය පවත්වන ලදි.

## 03.5. ගුරු භවතුන් සඳහා ගුරු දීමනා, නිල ඇඳුම් ලබා දීම.




ප්‍රස්තාරය 03.5 - 2017 - දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව

දහම්පාසල් ගුරු භවතුන් උදෙසා 2006 වසරේ සිට පුස්තකාල දීමනා ලෙස රුපියල් 2000 ක් ලබාදෙනු ලැබූ අතර 2017 වසරේ සිට ගුරු දීමනා වශයෙන් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 321 ක දහම් පාසල් 10,018 ක් සඳහා ලබා දෙන ලදි.

එම දීමනා ලැබීමට සුදුසුකම් ලැබූ මුළු සංඛ්‍යාව 95,156 ක් වේ. එක් ගුරු භවතෙකු සඳහා රුපියල් 5,000.00 ක වාර්ෂික පුස්තකාල දීමනාවක් ගෙවනු ලැබේ. ඒ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 494,000,000.00 වන අතර වියදම රු. 475,738,000.00 ක් වේ.

නිස්සරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් 2004 වසරේ සිට දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුට ම නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.

නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ මහත් සොම්නසකිනි. නිල ඇඳුම් ප්‍රදානයත් සමඟ දහම් පාසල් ගුරුවරුන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වී තිබෙන බව ද දැකිය හැකිය. ඒ සමඟම දහම් පාසල් සිසු දරු දැරියන්ගේ ද වර්ධනයක් ඇති වී තිබේ. ඒ අනුව සදාචාරවත් සමාජයක් ගොඩනැඟීම සඳහා මෙලෙස දහම් පාසල් ගුරුවරුන් හට නිල ඇඳුම් ප්‍රදානය කිරීම මහෝපකාරී වේ. රජය මේ සඳහා සෑම වසරක දී ම රුපියල් මිලියන සියයකට අධික මුදලක් වැය කරනු ලබයි. ඒ අනුව මෙවර ද රුපියල් මිලියන 127.9 ක් පමණ ඒ වෙනුවෙන් වැය කර ඇත. ඒ අනුව 2017 වර්ෂයේ දහම් පාසල් ගුරුභවතුන් 83,000 ක් මේ සඳහා සුදුසුකම් ලැබූ අතර ඔවුන් සියළු දෙනා සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.

## 03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය

මෙම විභාගය පැවැත්වීමෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

1. දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම.
2. දහම් පාසල්හි ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරු භවතුන්ගේ සේවය අගය කිරීම.
3. ගුරු භවතුන්ගේ දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම.
4. දහම් පාසල් ගුරු භවතුන් සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම හා එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම

**ප්‍රස්තාරය 03.6 - දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාග ප්‍රතිඵල - 2017**




2017 වර්ෂයේ දිස්ත්‍රික්ක 19 ක අපේක්ෂකයන් සඳහා විභාග මධ්‍යස්ථාන 24 ක දී මෙම විභාගය පවත්වන ලදි. ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 8703 කි. ඒ අතරින් 8655 දෙනෙක් විභාගය සඳහා සුදුසුකම් සපුරන ලද අතර ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව 5413 කි. ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 3242 වන අතර එය විභාගය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 37.45% ක ප්‍රතිශතයකි.

2017 ජුලි මස 15 දින පැවැත්වූ මෙම විභාගය සඳහා රු. 1475980.00 ක මුදලක් වැය වී ඇත. 2017 ඔක්තෝම්බර් මස 09 දිනය වන විට ප්‍රතිඵල නිකුත් කිරීම සිදු විය.

## 03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම

දහම් පාසල් සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම උදෙසාත්, නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් සිසු නිපුණතා ඇගයීමේ වැඩසටහන මෙම වර්ෂයේ ද අති සාර්ථකව පවත්වනු ලැබීය.

මෙම සිසු නිපුණතා ඇගයීම පවත්වන්නේ දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් අදියර හතරකිනි.

මෙවර වැඩසටහන පැවැත්වූයේ නුවරඑළිය උසස් බාලිකා විද්‍යාලය හා හොලිට්‍රිනිටි දෙමළ විද්‍යාල වලදී වන අතර ප්‍රධාන ආරාධිතයා වශයෙන් ගරු බුද්ධශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු විය.

ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 10,000.00 බැගින් ද, දිස්ත්‍රික් සංවිධාන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 18,000.00 බැගින් ද ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත මුදල රු. 15,808,006 වන අතර රු. 16,000,000 ක් 2017 වර්ෂය වෙනුවෙන් වැය විය.





## 03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

වර්ෂයට අවශ්‍ය පෙළ පොත් ප්‍රමාණය දහම් පාසල් මඟින් දැනුම් දීමෙන් අනතුරුව පොත් මුද්‍රණය සිදු කරනු ඇත. මෙම පොත් මුද්‍රණය කිරීම රජයේ මුද්‍රණාලයෙන්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් සිදු කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. 150,000,000 ක් ද, වැය වූ සම්පූර්ණ වියදම රු. 149,994,482 කි.

එම පොත් මුද්‍රණය කරවා 2017 වර්ෂයට සියළුම දහම් පාසල් වලට බෙදා දිය හැකි පරිදි දෙපාර්තමේන්තුවේ ගබඩාවට භාර දීමෙන් පසු දිවයින පුරා පිහිටි ලියාපදිංචි දහම් පාසල් වලට බෙදා හැරීම සිදු කරන ලදි.

දහම් පාසල් 9 ශ්‍රේණිය පෙළ පොත මෙම වසරේ දී ප්‍රතිනිර්මාණය කරන ලදි.

| | |
|---|---|
| මුළු දිස්ත්‍රික්ක ගණන | = 22 |
| ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගණන | = 321 |
| දහම් පාසල් ගණන | = 9951 |
| බෙදා හරින ලද මුළු පොත් ගණන | = 2385379 |

වගුව 03.5 - දහම් පාසල් පෙළ පොත් බෙදීම 2017 - සාරාංශය

## 03.9. බුද්ධ ජයන්ති පොත් හල

මහජනතාවගේ අවශ්‍යතාව සඳහා දහම් පොත් අලෙවි කිරීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත් හල මඟින් සිදු කරනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ විශ්වකෝෂ ඇතුළු පොත් වර්ග හැට හතරක් (64) මෙහි අලෙවිය සඳහා තිබේ.

2015 වසරේ පොත් අටසිය හැට හතරක් (864) පමණ අලෙවි කර ඇති අතර රුපියල් 736,127.00 ක මුදලක් ලැබී ඇත. එම මුදල් ඒ ඒ දිනවල ප්‍රධාන කාර්‍යාලය වෙත භාර දෙන ලදි.

පොත් හල පවත්වා ගෙන යන කාමරයට වේයන්ගෙන් උවදුරු ඇති වූ බැවින් කෘමි උවදුරු සඳහා බෙහෙත් යොදන ලදි. පොත් තැබීම සඳහා දෙපාර්තමේන්තුව සතු යකඩ රාක්කයක් පිළිසකර කොට පොත් හල වෙත ලබා ගන්නා ලදි.

# 04

# සංවර්ධන අංශය

## 04.1. සිල් මෑණියන්වහන්සේලා සම්බන්ධ කටයුතු

### 04.1.1 සිල්මාතා අධ්‍යාපන ආයතන වැඩි දියුණු කිරීම.

දිවයින පුරා විසිරී සිටින සිල් මෑණියන්වහන්සේලා සඳහා තම අධ්‍යාපනික මට්ටම ඉහළ නංවා ගනිමින් දැනුම වර්ධනය කර ගැනිමට අවස්ථාව සලසා දීම සඳහා සිල්මාතා අධ්‍යාපන ආයතන පිහිටුවා ඇති අතර මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා පුහුණු ආයතනයේ 2017 වසරේ කෙටිකාලීන පාඨමාලාව 2017.07.03 දින සිල්මෑණියන් වහන්සේලා 17 දෙනෙකු සඳහා ආරම්භ කෙරුණු පාඨමාලාවේ අවසන් විභාගය 2017.12.25 වන දින පවත්වා පාඨමාලාව අවසන් කර සහතික ප්‍රදානය සිදු කරන ලදී.කෙටිකාලීන පාඨමාලාව සඳහා හා සිල්මාතා පුහුණු ආයතනයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය රු.මිලියන දෙකක ප්‍රතිපාදන ලබා දී ඇත.
මේ වන විට කැළණිය ඊරියවැටිය සිල්මාතා මූලස්ථානයේ ඉදිකිරීම් කටයුතු, උද්‍යාන අලංකරණ කටයුතු හා තීන්ත ආලේප කිරීමේ කටයුතු අවසන් කර ඇත. විදුලි සෝපානය සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. 2018 වසරේ මැයි මස සිල්මාතා මූලස්ථානය විවෘත කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.

## 04.1.2 සිල් මෑණියන්වහන්සේලා ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් සිල් මෑණියන්වහන්සේලා සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම හා සිල් මෑණියන් වහන්සේලා ලියාපදිංචිය සිදු කරන අතර දැනට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින සිල් මෑණියන්වහන්සේලා සංඛ්‍යාව 1816 ක් වන අතර එය පහත පරිදි වේ.




## 04.1.3 සිල්මාතා ආරාම ලියාපදිංචි කිරීමේ කටයුතු

දැනට ලංකාවේ ලියාපදිංචි සිල් මාතා ආරාම සංඛ්‍යාව පහත පරිදි වේ.




## 04.1.4. ජාතික සිල්මාතා සංගමය

මේ යටතේ ජාතික සිල්මාතා සංගමයේ රැස්වීම් හා දිස්ත්‍රික් සිල්මාතා රැස්වීම් පැවැත්වීම සිදුකරන අතර එම රැස්වීම් සංවිධානය, එම රැස්වීම් වලට සහභාගි වන සිල් මෑණියන්වහන්සේලා සඳහා ගමන් වියදම්, දානය

සැපයුම් වෙනුවෙන් ගෙවීම වෙනුවෙන් වියදම් දරනු ලබයි. 2017 වසරේ ජාතික සිල්මාතා සංගමයේ සමස්ත ලංකා රැස්වීම් 03 ක් හා කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් 01ක් පවත්වා ඇත. දිස්ත්‍රික් සිල්මාතා සංගම් රැස්වීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා ගමන්වියදම් ලබා දී ඇත.

## 04.2 කලා ශිල්ප සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.

දේශීය කළා ශිල්ප නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණක් බැවින් එකී කාර්යය වෙනුවෙන් සිදුකරන කාර්යයන් සඳහා මූල්‍යමය ආධාර පිරිනැමීම සිදුකරනු ලබයි. විශේෂයෙන් ශ්‍රී ලාංකීය අභිමානය සුරැකීමත් එකී කලා ශිල්පීන්ගේ දක්ෂතාවන් නැංවීමට කිසියම් උනන්දුවක් ඇති කරලීම අනාගත ලෝකයට දේශීය කලාවන් දායාද කිරීම සේ සලකා මෙම කාර්යය නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි.ඒ අනුව බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට හා ප්‍රාදේශීයව සංවිධානය වන පෙරහැර, සංස්කෘතික අංග සඳහා අනුග්‍රහය දැක්වීම යටතේ කලා ශිල්ප සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 කට ප්‍රතිපාදන ලබා දී ඇත.

## 4.3.දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම.

### 04.3.1 දහම් පාසල් ගොඩනැගිලි ආධාර

නව ගොඩනැගිලි ඉදි කිරීම, සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රුපියල් 200,000.00 ක උපරිම ආධාර මුදල් ලැබීම සුදුසු දහම් පාසල් වෙත මෙමඟින් ප්‍රදානය කරනු ලබයි. ඒ අනුව දහම් පාසල් 49 ක් සඳහා රු. 9,800,000/- ක් පිරිනමා ඇත.



### 04.3.2 දහම් පාසල් උපකරණ ආධාර

දහම් පාසල් උපකරණ වෙනුවෙන් (ඩෙස්ක්, බංකු හා අත්‍යවශ්‍ය උපකරණ) රුපියල් 100,000 ක උපරිම ආධාර මුදල් සුදුසුකම ලද දහම් පාසල් වෙත ප්‍රදානය කරනු ලබයි.ඒ අනුව දහම් පාසල් 102 ක් සඳහා රු.10,200,000 ක් පිරි නමා ඇත. මේ යටතේ දහම් පාසල් සංවර්ධන කාර්යය සිදුකරනු ලබයි.




## 04.4 විහාරස්ථ කාර්ය සාධක සමිති, දායක සභා හා විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීමේ කටයුතු

| අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථ දායක සභා ගණන | සිල් මාතා ආරාම දායක සභා ගණන | විහාරස්ථ කාර්ය සාධක සමිති ගණන | විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ගණන |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 132 | 09 | 353 | 23 |
| 2 | කළුතර | 184 | 07 | 284 | 58 |
| 3 | ගම්පහ | 228 | 17 | 229 | 45 |
| 4 | ගාල්ල | 264 | 06 | 291 | 63 |
| 5 | මාතර | 247 | 06 | 297 | 51 |
| 6 | හම්බන්තොට | 212 | 08 | 189 | 43 |
| 7 | කුරුණෑගල | 680 | 27 | 223 | 18 |
| 8 | පුත්තලම | 129 | 02 | 72 | 18 |
| 9 | මහනුවර | 312 | 13 | 409 | 66 |
| 10 | මාතලේ | 92 | 03 | 152 | 8 |
| 11 | මඩකලපුව | 05 | 0 | 1 | 0 |
| 12 | මන්නාරම | 03 | 0 | 0 | 1 |
| 13 | කිලිනොච්චිය | 0 | 0 | 0 | 0 |
| 14 | නුවරඑළිය | 116 | 03 | 87 | 26 |
| 15 | මොණරාගල | 95 | 02 | 108 | 39 |
| 16 | බදුල්ල | 148 | 04 | 167 | 14 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | කෑගල්ල | 253 | 18 | 289 | 114 |
| 18 | රත්නපුර | 251 | 05 | 217 | 72 |
| 19 | ත්‍රිකුණාමලය | 28 | 0 | 34 | 1 |
| 20 | අනුරාධපුර | 210 | 11 | 257 | 15 |
| 21 | පොළොන්නරුව | 100 | 09 | 100 | 1 |
| 22 | අම්පාර | 25 | 0 | 84 | 11 |
| 23 | වව්නියාව | 21 | 0 | 5 | 0 |
| 24 | මුලතිව් | 01 | 0 | 1 | 0 |
| 25 | යාපනය | 05 | 0 | 0 | 0 |
| | එකතුව | 3741 | 150 | 3849 | 687 |

## 04.5 ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරිම.

### 04.5.1 ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයිම.

දිවයිනේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 322 ක් ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 22 ක ක්‍රියාත්මක වන මෙම ශාසනාරක්ෂක මණ්ඩල මඟින් ප්‍රාදේශීය වශයෙන් සිදුකරන කාර්යභාරය වෙනුවෙන් අවශ්‍ය උපකරණ මෙමඟින් ලබා දීම සිදුකරයි.ශාසනාරක්ෂක මණ්ඩල යටතේ විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල හා දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක වේ. ගම් මට්ටමින් පවතින සංවර්ධන කාර්යයන් ද මෙම මණ්ඩලය ඔස්සේ සිදුවේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | දි/ලේ/කා සහප්‍රදේශීය ලේකම් කාර්යාලය | ලබාදෙන උපකරණ | වෙන්කර ඇති ප්‍රතිපාදන | දිස්ත්‍රික්ක අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| 1 | මොණරාගල | බඩල්කුඹුර | පරිගණකය | 80000.00 | 480,000.00 |
| 2 | | මැදගම | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 3 | | බිබිල | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 4 | | මඩුල්ල | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 5 | | බුත්තල | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 6 | කුරුණෑගල | උඩුබද්දාව | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 400,000.00 |
| 7 | | කොටවෙහෙර | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 8 | | රස්නායකපුර | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 9 | | ගනේවත්ත | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 10 | බදුල්ල | බදුල්ල දි/ලේ/කා | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 380,000.00 |
| 11 | | සොරණාතොට | පරිගණකය | 80000.00 | |
| 12 | | වැලිමඩ | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 13 | | ලුණුගල | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 14 | මාතලේ | විල්ගමුව | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | | මාතලේ | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 280,000.00 |
| 16 | | නාඋල | පරිගණකය | 80000.00 | |
| 17 | මහනුවර | උඩුදුම්බර | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 360,000.00 |
| 18 | | හතරලියද්ද | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 19 | | අකුරණ | පරිගණකය | 80000.00 | |
| 20 | | දෙල්තොට | පරිගණකය | 80000.00 | |
| 21 | කෑගල්ල | දි/ලේ/කා | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 380,000.00 |
| 22 | | දැරණියගල | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 23 | | මාවනැල්ල | පරිගණකය | 80000.00 | |
| 24 | | ගලිගමුව | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | |
| 25 | මාතර | තිහගොඩ | පරිගණකය | 80000.00 | 80,000.00 |
| 26 | කළුතර | ඉංගිරිය | පරිගණකය | 80000.00 | 80000.00 |
| 27 | කොළඹ | මොරටුව | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 100,000.00 |
| 28 | ගාල්ල | නාගොඩ | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 100,000.00 |
| 29 | පුත්තලම | මහකුඹුක්කඩවල | පරිගණකය | 80000.00 | 80,000.00 |
| 30 | රත්නපුර | නිවිතිගල | පරිගණකය | 80000.00 | 80,000.00 |
| 31 | අම්පාර | මහඔය | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 100,000.00 |
| 32 | නුවරඑළිය | අඹගමුකෝරළය | පරිගණකය/ප්‍රින්ටරය | 100000.00 | 100,000.00 |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | | | | **3,000.000.00** | **3,000.000.00** |

### 04.5.2 ශාසනාරක්ෂක මණ්ඩල වියදම් දැරීම.

මේ යටතේ ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීම ,එම රැස්වීම් සංවිධානය කිරීම හා එම රැස්වීම් වලට සහභාගි වන ස්වාමින්වහන්සේලාගේ ගමන් වියදම් ගෙවීම , දානය සැපයුම් වෙනුවෙන් වියදම් දැරීම සිදු කරනු ලබයි. 2017 වසරේ දි සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් 03 ක් හා කාත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම් 05 ක් ද පවත්වා ඇත. සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල නිලවරණ පවත්වා අවසන් කරන ලද අතර 2017.10.11 වන දින සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල නිලවරණය පවත්වා නව නිලධාරි මණ්ඩලය පත් කර ගන්නා ලදි.

## 04.6 ජාතික උත්සව සංවිධානය කිරීම.

### 04.6.1 නිදහස් පිරිත

2017 පෙබරවාරි මස 02 වන දින කොළඹ 07 නිදහස් මන්දිරයේදී සර්ව රාත්‍රික පිරිත් දේශනාව ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඥාණිස්සර මහානායක ස්වාමින්වහන්සේගේ අනුශාසනා පරිදි අමරපුර ධර්මරක්ෂිත නිකායේ මහානායක අතිපූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක ස්වාමින්වහන්සේ ඇතුළු ගෞරවනීය මහා සංඝ රත්නය විසින් පවත්වන ලදී.මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය පරිපාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා , ගරු බුද්ධශාසන හා අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඇතුළු මැතිඇමතිවරුන්, රාජ්‍ය නිලධාරින් හා බොදු උවැස උවැසියන් බොහෝ පිරිසක් සහභාගි වූහ.

 

## 4.6.2 ජාතික නිදහස් දින ආගමික වතාවත්

2017 පෙබරවාරි මස 04 වන දිනට යෙදී තිබූ 69 වන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් බෞද්ධාගමික වැඩසටහන පෙ.ව. 6.00ට කොළඹ 03 ධර්මකීර්ත්‍යාරාමයේදී (පොල්වත්ත පන්සල)වැතර මහින්ද නායක ස්වාමින්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ,ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා , ගරු බුද්ධශාසන හා අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඇතුළු මැතිඇමතිවරුන්, රාජ්‍ය නිලධාරීන් හා බොදු උවැස උවැසියන් මෙන්ම පාසල් දුවා දරුවන් පිරිසක්ද සහභාගි වූහ.

## 4.6.3. රාජ්‍ය වෙසක් උත්සවය

ශ්‍රී බු.ව. 2561 වන රාජ්‍ය වෙසක් උත්සවය"ධම්මචාරී සුඛං සෙති " (දැහැමි දිවිය සැපත සදයි) යන තේමා ව මූලික කර ගනිමින් 2017 මැයි මස 09 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපතිතුමගේ ප්‍රධානත්වයෙන් කැගල්ල දිස්ත්‍රික්කයේ වට්ටාරම රජ මහ විහාරස්ථානයේදී පවත්වන ලදී.

**වෙසක් සතිය වැඩ සටහන (2017.05.07 සිට 2017.05.13)**

දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙසක් සතිය තුළ පහත සඳහන් මාතෘකා යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. එසේම කැගල්ල දිස්ත්‍රික්කයෙහි 2017 ජනවාරි මස සිට මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| | |
|---|---|
| 2017.05.07 | සෞඛ්‍ය හා බුදු දහම |
| 2017.05.08 | පරිසරය හා බුදු දහම |
| 2017.05.09 | සාහිත්‍ය හා බුදු දහම |
| 2017.05.10 | පොහෝදින සිල් වැඩ සටහන |
| 2017.05.11 | කලාව හා බුදු දහම වැඩසටහන සහ පිණ්ඩපාත වැඩ සටහන |
| 2017.05.12 | රාජ්‍ය සේවකයා හා බුදු දහම |
| 2017.05.13 | සමාජ සංවර්ධනය, ආර්ථිකය හා බුදු දහම |









### 4.6.4. මහානායක ස්වාමින් වහන්සේලාගේ සන්නස් පත්‍ර පිළිගැන්වීමේ උත්සව කටයුතු

ශ්‍රී ලංකා අමරපුර නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහානායක ස්වාමින්වහන්සේ වෙත ශ්‍රී සන්නස් පත්‍රය පිළිගැන්වීමේ උත්සවය 2017 අගෝස්තු මස 03 වන දින කොළඹ 07 නිදහස් මන්දිරයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.





### 4.6.5. ශ්‍රී සංඝමිත්තා මහරහත් තෙරණින්වහන්සේගේ ගුණ සමරු උළෙල

ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ 2325 වන ගුණ සමරු උළෙල සහ සංඝමිත්තා පෙරහැර 2017.12.03 හා 04 දිනයන්හිදී අනුරාධපුරයේදී පවත්වන ලදී.









## 4.7 උපසම්පදා උත්සව සංවිධානය

2017 වර්ෂයේදී ඒ ඒ නිකාය පාර්ශ්ව වල ගරු ලේඛකාධිකාරි ස්වමාන්වහන්සේලා විස්තර ලබා දුන් උපසම්පදා අපේක්ෂක සාමණේර ස්වාමින්වහන්සේලා වෙත උපසම්පදා පුණ්‍යකර්ම සිදුකරන ස්ථානවලදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ගමන් වියදම් දීමනාව ප්‍රදානය කරනු ලැබීය.

| නිකාය පාර්ශ්වය | ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද ගමන් වියදම් මුදල |
|---|---|---|
| ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශවය | 33 | 99,000.00 |
| ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි මල්වතු මහා විහාර පාර්ශවය | 350 | 1,050,000.00 |
| ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව | 355 | 1,065,000.00 |
| ඌවේ ස්‍යාමෝපාලී මහානිකායේ වංශික පාර්ශවය | 5 | 15,000.00 |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රි ධර්ම මහා සංඝ සභාව | 41 | 123,000.00 |
| ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශවය | 33 | 99,000.00 |
| **එකතුව** | **817** | **2,451,000** |

## 4.8 ආදාහන පූජෝත්සව ආධාර

මේ යටතේ විවිධ ප්‍රදේශ වල ස්වාමින්වහන්සේලා හා සිල් මෑණියන්වහන්සේලාගේ ආදාහන පූජෝත්සව 153 ක් වෙනුවෙන් රු. 1,487,500.00 ක මුදල් ප්‍රදානයක් සිදු කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආදාහන සංඛ්‍යාව | ලබාදුන් ප්‍රතිපාදන |
|---|---|---|---|
| 01 | කොළඹ | 09 | 82,500 |
| 02 | කළුතර | 03 | 27,500 |
| 03 | ගම්පහ | 10 | 90,000 |
| 04 | ගාල්ල | 09 | 95,000 |
| 05 | මාතර | 07 | 60,000 |
| 06 | හම්බන්තොට | 08 | 55,000 |
| 07 | රත්නපුර | 08 | 92,500 |
| 08 | අනුරාධපුර | 14 | 157,500 |
| 09 | මහනුවර | 13 | 117,500 |
| 10 | කෑගල්ල | 13 | 137,500 |
| 11 | නුවරඑළිය | 01 | 10,000 |
| 12 | බදුල්ල | 11 | 95,000 |
| 13 | මාතලේ | 09 | 102,500 |
| 14 | පොළොන්නරුව | 02 | 17,500 |
| 15 | කුරුණෑගල | 05 | 42,500 |
| 16 | මොණරාගල | 28 | 282,500 |
| 17 | පුත්තලම | 02 | 15,000 |
| 18 | අම්පාර | 01 | 7,500 |
| | එකතුව | 153 | 1,487,500 |

## 4.9 සිව්පස ආධාර ලබා දීම.

මෙම වැඩසටහන මගින් තෝරාගත් දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි විහාරස්ථාන වල සිව්පසය සපයා ගැනීමට අපහසු ස්වාමින් වහන්සේලා සඳහා ආධාර ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව 2017 වසරේදී විහාරස්ථාන 261 ක ස්වාමින් වහන්සේලා 920 ක් සඳහා සිව්පස ආධාර ලබා දී ඇත.

## 4.10 විහාරස්ථාන සඳහා දුරකථන, විදුලිය හා ජලය සහනදායී පදනම මත ලබා දීම.

පූජනිය ස්ථාන සඳහා දුරකථන, විදුලිය හා ජලය සඳහා සහනදායි පදනම මත ගාස්තු අය කිරිමට අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදු කරේ. ඒ අනුව 2017 වසර තුළදී විහාරස්ථාන 09 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

# 05

# ව්‍යාපෘති අංශය

## 05.1. දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව

**2017 වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය =රු.7,000,000/-**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලිවිශ්වවිද්‍යාලය ඒකාබද්ධව ආරම්භ කරන ලද (2016.08.20 ) දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2017 ජුනි මස දක්වා පමණ පැවැත්විණි. එම **පාඨමාලාවේ දේශක දීමනා වශයෙන් ගෙවීමට ඉතිරිව තිබූ රු.690,000/- ක මුදලක්** පාඨමාලාව පවත්වන ලද මධ්‍යස්ථාන 23 ක් වෙනුවෙන් ලබා දීමට අදාළ දි.ලේ.කා හා ප්‍රා.ලේ.කා වෙත ප්‍රතිපාදන වෙන් කරන ලදී.

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ඒකාබද්ධව පවත්වන ලද 2016 වර්ෂයේ පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අවසන් කර එහි විභාග කටයුතු 2017/09/23,24, හා 30 යන තෙදින තුල දිස්ත්‍රික්ක 19 ක් නියෝජනය කරමින් මධ්‍යස්ථාන 13 කදී පවත්වන්නට යෙදුණි. එම විභාග කටයුතු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සියළුම කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. විභාගය කටයුතු සඳහා දි.ලේ.කාර්යාල 13 ක් වෙත රු.483,187 /-ක මුදලක් ලබා දීමට කටයුතු කරන ලදී. ඉන්ධන වියදම් ඇතුළු අනෙකුත් වියදම් ද සමඟ මුළු විදයම රු.500,119/- කි.

2016 වර්ෂයේ පාඨමාලාව සඳ හා අනුමත ඇස්තමේන්තුව (රු.3,879,900/-) ට අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට තවදුරටත් ගෙවීමට නියමිතව තිබූ රු.2,684,800/-ක මුදල ලබා දීමට කටයුතු කෙරුණි.

2007 වර්ෂයේ සිට වාර්ෂිකව පවත්වන ලද දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව වඩාත් ගුණාත්මක පාඨමාලාවක් බවට පත්කිරීම සඳහා බෞද්ධ කටයුතු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් යෝජනා විය. ඒ අනුව මෙම ආයතන දෙක විසින් මෙම පාඨමාලාව සම්බන්ධයෙන් සාකච්ඡාකර කරන ලදී . ඒ අනුව වඩාත් ගුණාත්මක පාඨමාලාවක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරුණි. එහිදී මෙතෙක් එක් අවුරුදු පාඨමාලාවක් වශයෙන් පවත්වගෙන එන ලද දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව පළමු වසර හා දෙවන වසර වශයෙන් වසර 02 කදී පවත්වන්නට තීරණය විය. දෙවන වසර සමත්වන දහම් පාසල් ගුරු භවතුන් සඳහා පමණක් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව ලබා දීමට ද තීරණය කර ඇත. එහිදී පළමු වසර සඳහා විෂයන් 06 කින් සමන්විත නව විෂය නිර්දේශයක් හඳුන්වා දීම සිදුවිය .ඊට අමරතව එක් දිනක ප්‍රායෝගික භාවනා පුහුණුවක් ද පාඨමාලා කාලය තුලදී සියළුම පාඨමාලා ලාභී දහම් පාසල් ගුරු භවතුන් වෙනුවෙන් ලබා දීමට ද තීරණය කර ඇත. දෙවන වසර සඳහා ප්‍රායෝගික පුහුණුවීම් ද ඇතුළත්ව නව විෂය නිර්දේශයක් හඳුන්වා දීමට නියමිත අතර ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී සාකච්ඡා කිරීමට නියමිතය. පාඨමාලාව සකස් කිරීමේ සම්පත් දායක වියදම දළ වශයෙන් රු.95,900/- කි.

මේ අනුව සකස්කරන ලද නව පාඨමාලාව එනම් 2017 පාඨමාලාව *( දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා උසස් පාඨමාලාව- (පළමුවසර)* සඳහා අයදුම්පත්‍ර බාර ගැනීම සම්බන්ධයෙන් දිවයිනේ සියළුම දහම් පාසල් දැණුවත් කිරීමට කටයුතු සිදු කරන ලදී. ඒ අනුව 2017-11-24 දිනට අයදුම්පත්‍ර බාර ගැනීමේ කටයුතු අවසන් කිරීමටත් 2017-12-22 දිනට පෙර තෝරාගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය වෙත බාරදීමටත් තීරණය කරන ලදී. එම කටයුතු දි.ලේ.කා.19 කදී පැවැත්විණි. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පාඨමාලාව ආරම්භ කිරීම

වෙනුවෙන් අවශ්‍ය වියදම් වෙනුවෙන් එක් දි.ලේ.කා.වෙනුවෙන් රු.9,000/- ක් බැගින් රු.171,000/- වෙන්කර දීමට කටයුතු කර ඇත.

එසේම 2017 පාඨමාලාව වෙනුවෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් රු.5, 829,800/- ක දළ ඇස්තමේන්තුවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ අතර එම ඇස්තමේන්තුව සංශෝධනයට යටත්ව 2017 පාඨමාලාවේ වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට රු.2,400,000/- ක මුදලක් ලබා දීමට කටයුතු කර ඇත.

## 05.2. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන



දහම් පාසල් ගුරු සේවයට පිවිසෙන බොහෝ දෙනා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිසකි. එම පිරිස විවාහයල රැකියාවලඋසස් අධ්‍යාපනයට යොමු වීම වැනි විවිධ සාමාජීයීය සාධක මත දහම් පාසල් ගුරු සේවයෙන් ඉවත්වන අතර නව පිරිසක් දහම් පාසල් ගුරු සේවයට එක් වේ. ඒ අනුව සෑම අවස්ථාවකම මේ සඳහා එක්වන පිරිස නවකයින් වේ. මෙම ගුරුභවතුන් ගුරු පුහුණුවක් නොලද පිරිසක් වන බැවින් ගුරු භූමිකාවට සරිලන පරිදි පුහුණු කල යුතුව ඇත. එමෙන්ම දරුවන් සමඟ කටයුතු කිරීමේදී දරුවන්ගේ මානසික මට්ටම් හා හැකියාවන් හඳුනාගෙන කටයුතු කිරීම අනිවාර්ය වූවකි. එසේ නොවන්නේනම් සිදුවන්නේ අගතියකි. එම කරුණු ද පදනම් කරගෙන දහම් පාසල් ගුරුවරයාගේ දැනුමල ආකල්ප කුසලතාවන් ද වර්ධනය කෙරෙන ව්‍යාපෘතියක් වශයෙන් මෙම දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය සකස් කර ඇත. එමඟින් දහම් පාසල් ගුරුවරුන්ගේ කාර්යභාරය වඩාත් විශිෂ්ටත්වයටල ප්‍රවීණත්වයට පත්කිරීම හා දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය තවදුරටත් වැඩිදියුණු කිරීම ද අපේක්ෂා කෙරේ.

2017 වර්ෂයට මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල රු. 5,000,000.00 කි. දිස්ත්‍රික්ක 05 ක පැවැත් වූ ගුරු පුහුණු වැඩමුළු ගණන 25 කි. එමඟින් පුහුණු කල ගුරුභවතුන් ගණන 7000 කි. මේ සඳහා ගිය වියදම 4,779,480.00 කි.

## 05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම.

පරපුරෙන් පරපුරට නිර්මල බුදු දහමේ හරය දායාද කිරීමේ මූලස්ථානය දහම් පාසලයි. බුදු දහමින් පෝෂිත පරපුරක් බිහි කිරීමට ඇප කැපව නිශ්ශරණධ්‍යාශයෙන් කටයුතු කරන දහම් පාසල් ගුරු භවතුන් දිරිමත් කිරීමට හා ඔවුන්ට ගෞරවාන්විත සමාජ පරිසරයක් ගොඩනැඟීම පිණිස දහම් පාසල් ගුරු හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි. 2017 වර්ෂයේදී දහම් පාසල් ගුරු හැඳුනුම්පත් 1468 ක ප්‍රමාණයක් රුපියල් 148,665.17 ක වියදමින් සකස් කර ඇත.







රූපය

05.1 - දහම් පාසල් ගුරු හැඳුනුම්පතක ආදර්ශ ආකෘතියක්

## 05.4. බෞද්ධ විශ්වකෝෂය

2017 වර්ෂයේ රු.1,400,000.00 ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර පහත පරිදි වැය කරන ලදී.

බෞද්ධ විශ්ව කෝෂය IV නැවත මුද්‍රණය රු. 598,000.00

බෞද්ධ විශ්ව කෝෂය V නැවත මුද්‍රණය රු. 891,250.00

වැය කරනා ලද මුළු මුදල රු.1,409,250.00

2017 වර්ෂයේ රු.1,400,000.00 ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර පහත පරිදි වැය කරන ලදී
බෞද්ධ විශ්ව කෝෂය IV නැවත මුද්‍රණය රු. 598,000.00
බෞද්ධ විශ්ව කෝෂය V නැවත මුද්‍රණය රු. 891,250.00
වැය කරනා ලද මුළු මුදල රු.1,409,250.00

2018 ජනවාරි මස සිට නව කාර්යාලය පරිශ්‍රයකදී බෞද්ධ විශ්ව කෝශය සක්‍රීය ලෙස ආරම්භ කිරිමට කටයුතු සැලසුම් කරන ලදී. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයකින් නියෝජ්‍ය කර්තෘවරයකු හා සහකාර කර්තෘවරයකු බඳවා ගන්නා ලදී. ප්‍රධාන කර්තෘ ධුරයට අයදුම්පත් එකක් ඉදිරිපත් වී තිබුණු නමුත් ඔහු සම්මුඛ පරීක්ෂනයට සහභාගී නොවීම නිසා මහචාර්ය අසංග තිලකරත්න මහතා ඒ සඳහා පත්කර ලැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී

.

## 05.5. සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය හා මුද්‍රණය කිරීම.

වෙන්කර ඇති මුළු මුදල = **රු.3,000,000/-**

- සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩලයේ දීමනා ලෙස වැයකර ඇති මුදල = රු.1,012,000.00
- සං.ත්‍රි.ම.දානමය කටයුතු වෙනුවෙන් වැයකර ඇති මුදල = රු.288,648.59
- ග්‍රන්ථ සම්පාදන කටයුතු වෙනුවෙන් වැයකර ඇති මුදල = රු1,165,640.50

එකතුව = **රු.2,466,289.09**

**ග්‍රන්ථ සම්පාදන කටයුතු වෙනුවෙන් පහත පරිදි ප්‍රතිපාදන වෙන්කර ඇත.**

- සං.ත්‍රි.ග්‍ර.මාලා අංක 27 - සිංහල බුද්ධ වංශ චරියා පිටක පාළි ග්‍රන්ථය -පිටපත් 1000 රු.177,000/-
- සං.ත්‍රි.ග්‍ර.මාලා අංක 25- සිංහල ථේර අපදාන ග්‍රන්ථය- පිටපත් 1000 රු.415,078/-
- සං.ත්‍රි.ග්‍ර.මාලා අංක 26- සිංහල ථේරි අපදාන ග්‍රන්ථය- පිටපත් 1000 රු.194,062/50
- සං.ත්‍රි.ග්‍ර.මාලා අංක 21- සිංහල චුල්ල නිද්දේසපාලි ග්‍රන්ථය- පිටපත් 1000

රු.379,500/-

# 06

# භික්ෂු ලියාපදිංචි අංශය

## 06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම.

මෙම අංශය මඟින් සිදුවන සේවාවන්...

- නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම
- නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- උපැවිදි සහතික නිකුත් කිරීම.
- සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- ලියාපදිංචි කරන ලද සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල සහතික පිටපත් නිකුත් කිරීම.
- සාමණේර සහ උපසම්පදා ලේඛන පරිගණක ගත කර යාවත්කාලීන කිරීම.
- නීතිමය ගැටලු වල දී අවශ්‍ය සාක්ෂි ලබා දීම.
- භික්ෂු හැඳුනුම්පත් නිකුත් කිරීම.

2017 වර්ෂයේදී,

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 4,209 |
| ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 869 |
| නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව | - 1,246 |
| නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව | - 127 |

එමෙන්ම මෙම අංශය මගින් සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු පරිගණක ගත කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. එම මෘදුකාංගය මගින් දැනට උපසම්පදා භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු 16,111 ක් ද, සාමණේර ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු 35,853 ක් ද, දත්ත පද්ධතිය වෙත ඇතුළත් කර ඇත.

මෙමගින් සාමණේර සහ උපසම්පදා සහතික පත් ඉල්ලුම් කරන අයට එම සහතික පත් ඉක්මනින් නිකුත් කිරීමට අවස්ථාව සැලසී ඇත.

# 07
# තොරතුරු අංශය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2015 පෙබරවාරි 14 ස්ථාපිත කරන ලද තොරතුරු අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ දෙපාර්තමේන්තුව සතු විවිධ තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශි කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත තොරතුරු පනත යටතේ මුදාහැරීම යි. මීට අමතර පහත සඳහන් කාර්යන් මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

### විහාරස්ථාන දහම් පාසල් තොරතුරු යාවත්කාලීන කිරීම

2017 දෙසැම්බර් 31 දින වන විට යාවත්කාලීන කරන ලද විහාරස්ථාන, දහම් පාසල් ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමෙන් සංඛ්‍යා වශයෙන් දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | ලියාපදිංචි විහාරස්ථාන සංඛ්‍යාව | අයදුම්පත් ඉදිරිපත් කර ඇති විහාරස්ථාන සංඛ්‍යාව(අනුමත සහිත) | අයදුම්පත් ඉදිරිපත් නොකළ විහාරස්ථාන සංඛ්‍යාව | දිස්ත්‍රික්කවල එකතුව | ක්‍රියාත්මක දහම් පාසල් | සමස්ථ ගුරුවරුන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 743 | 106 | 34 | 883 | 657 | 11486 | 223541 |
| ගම්පහ | 646 | 164 | 28 | 838 | 751 | 11389 | 234421 |
| කළුතර | 532 | 141 | 19 | 692 | 591 | 8982 | 153447 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | 718 | 103 | 23 | 844 | 666 | 8434 | 148218 |
| මාතර | 500 | 118 | 14 | 632 | 523 | 7066 | 123654 |
| හම්බන්තොට | 409 | 94 | 33 | 536 | 431 | 5107 | 92629 |
| මහනුවර | 784 | 209 | 72 | 1065 | 866 | 10397 | 174120 |
| මාතලේ | 328 | 97 | 25 | 450 | 379 | 3810 | 62689 |
| නුවරඑළිය | 260 | 40 | 20 | 320 | 282 | 2821 | 43699 |
| කුරුණෑගල | 1164 | 342 | 105 | 1611 | 1209 | 13241 | 210940 |
| පුත්තලම | 277 | 60 | 8 | 345 | 319 | 3148 | 53331 |
| අනුරාධපුරය | 678 | 176 | 59 | 913 | 714 | 7350 | 127413 |
| අම්පාර | 152 | 44 | 4 | 200 | 187 | 2240 | 41446 |
| පොළොන්නරුව | 247 | 61 | 8 | 316 | 291 | 3435 | 62272 |
| ත්‍රිකුණාමලය | 109 | 24 | 12 | 145 | 91 | 1030 | 17754 |
| බදුල්ල | 358 | 125 | 16 | 499 | 477 | 5316 | 96492 |
| මොණරාගල | 280 | 75 | 20 | 375 | 313 | 3666 | 65435 |
| වවුනියාව | 27 | 2 | 1 | 30 | 20 | 224 | 3163 |
| රත්නපුර | 533 | 181 | 20 | 734 | 650 | 7551 | 131068 |
| කැගල්ල | 577 | 136 | 44 | 757 | 590 | 6762 | 101732 |
| මන්නාරම | 4 | 0 | 5 | 9 | 0 | 0 | 0 |
| යාපනය | 6 | 0 | 3 | 9 | 0 | 0 | 0 |
| කිලිනොච්චිය | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| මුලතිව් | 12 | 2 | | 14 | 11 | 138 | 1904 |
| මඩකලපුව | 16 | 1 | 0 | 17 | 0 | 0 | 0 |
| එකතුව | **9361** | **2301** | **573** | **12235** | **10018** | **123593** | **2169368** |

## පාලි භාෂා ප්‍රර්ධන වැඩසටහන

දහම් පාසල් ක්ෂේත්‍රයෙහි පාලි භාෂා දැනුම ඇති ගුරු හවතුන්ගේ පවතින හිගයට විසඳුමක් ලෙසින් මෙම වැඩසටහන වාර්ෂිකව සිදුකරනු ලබයි. මෙහිදි පාලි භාෂා දැනුමෙන් දහම් පාසල් ගුරුවරයා පෝෂණය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදවිම මෙහි අපේක්ෂිත අරමුණයි. මිට අමතර ව ත්‍රිපිටකය පරිශීලනය සඳහා ලැදියාවක් ඇති කිරීම ද මෙමගින් සිදු වේ.

පාලි භාෂා දැනුමැති ප්‍රවීණයන් ලවා සකස් කළ විෂය නිර්දේශයක් ඇසුරෙන් සකස් කළ නිබන්ධන පාඨමාලා ලාභීන් වෙත සපයාදෙමින් දිවයිනේ 17 ක තෝරාගත් මධ්‍යස්ථාන 17 ක දී මෙම පාඨමාලාව සාර්ථකව සිදු කළ අතර පාඨමාලා ලාභින් සංඛ්‍යාව 1400 කි.

### භික්ෂු පුහුණු වැඩසටහන්

සාමණේර ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප වර්ධනය කරලීම සඳහා විනයධර ධර්මධර යතිවරයන් වහන්සේලාගේ මගපෙන්වීම මත මෙම භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන සිදුකරයි. නේවාසික පුහුණු වැඩසටහනක් වශයෙන් තෙදිනක් පුරා පැවැත්වෙන මේ තුළ සම්ප්‍රදායානුකූල පිරිත් දේශනා හා ධර්ම දේශනා පුහුණු, භාවනා ක්‍රමයන් පිළිබඳ දැනුම ලබා දීම, ශාසනික වත් පිළිවෙත් ප්‍රගුණ කිරීම ආදී භික්ෂූන් වහන්සේ නමකට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම සිදුකරයි.

### මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති ඒකකයේ ප්‍රතිපාදන මත මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. මෙහි මුඛ්‍ය පරමාර්ථය මත්ද්‍රව්‍ය නිවාරණයට අවශ්‍ය සම්පත්දායකයන් පුහුණු කිරීමයි. ඒ අනුව දිවයින පුරා සම්පත්දායකයන් 256 ක් පුහුණුව ලබා ඇති අතර ඔවුන් විසින් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල වැඩසටහන් රාශියක් සිදු කර ඇත.

| වැඩ සටහන පැවැත් වූ දිනය | දින ගණන | පැවැත්වූ ස්ථානය | ආවරණය කර දිස්ත්‍රික්ක | සහභාගි වූ සංඛ්‍යාව | වියදම් වූ මුදල රු. |
|---|---|---|---|---|---|
| 2017/01/13.14.15 | 3 | වයඹ පුහුණු ආයතනය | කෑගල්ල / පුත්තලම | 57 | 191,887.00 |
| 2017/01/ 27,28,29 | 3 | වයඹ පුහුණු ආයතනය | කුරුණෑගල | 72 | 173,915.00 |
| 2017/04/ 01,02,03 | 3 | නායකත්ව පුහුණු ආයතනය - ඇඹිලිපිටිය | මාතර/හම්බන්තොට/බදුල්ල/රත්නපුර/අම්පාර/මොණරාගල | 76 | 272,556.00 |
| 2017/07/ 28,29,30 | 3 | ජාතික අධ්‍යාපන ආයතනය - මීපේ | කොළඹ / ගම්පහ/ කළුතර/ගාල්ල/නුවරඑළිය | 51 | 164,270.00 |
| | | | එකතුව | 256 | 802,628.00 |
| | | | | මුළු වියදම රු. | 831,990.00 |

## කල්‍යාණ මිත්‍රසමාජය

ශ්‍රී ලාංකික සමාජය විශාල පරිහානියකට පත්ව තිබෙන බව නිරන්තරයෙන් ප්‍රකාශ වන කරුණකි.එහි යම් සත්‍යතාවයක් ඇති බව පෙනෙන්නට තිබේ. එක් අතකින් විෂ සහිත මත්ද්‍රව්‍ය භාවිතය බහුල වෙමින් පවතී.මද්‍යසාර දුම්වැටි භාවිතය බහුල වෙමින් ඇත. විවිධ අපචාර දූෂණ අකටයුතුකම් ගැන සෑම සමාජ සංස්ථාවක් තුළම අසන්නට ලැබේ. විවිධ ක්ෂේත්‍රවල අතීතයේ සිටි ආදර්ශවත් අගනා චරිත වර්තමාන පරම්පරාව තුළින් බිහිවන ලකුණු පෙනෙන්නට නැත. එබැවින් දහම් පාසල් මුල්කරගෙන එබදු ආදර්ශවත් නායකයන් බිහි කිරීමට වැඩ සටහනක් දියත් කිරීම අත්‍යවශ්‍ය වේ .එ සඳහා අවශ්‍ය දැනුම,කුසලතා, හා ආකල්ප දරුවන් තුළ සංවර්ධනය කිරීමට ප්‍රායෝගික අභ්‍යාස සහිත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ඒ අනුව 2017 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති අංශය මගින් රුපියල් මිලියන 200 ක් ලබා දුන් අතර එමගින් කල්‍යාණ මිත්‍ර සමාජ දැනුවත් කිරීම් වැඩසටහන් 258 සිදු කරන ලදි. ඒ සඳහා වියදම් මුදල රු. 14,238,129.60 කි. පුහුණු වැඩමුළු සඳහා සහභාගි වූ සංඛ්‍යාව 23417 කි.

### පුස්කොළ පොත් සංරක්ෂණ වැඩසටහන

දිවයිනේ ඉපැරණි විහාරස්ථානවල ඇති වටිනා පුස්කොළ පොත් සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර දැනට නියමු ව්‍යාපෘතියක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුස්කොළ පොත් ඇති විහාරස්ථාන හඳුනාගෙන සංරක්ෂණය කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත. මේ සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දෙයි. සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම එක් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් මේ සඳහා පුහුණු කෙරේ.

### සුබපැතුම් පණිවුඩ සැකසීම

පුවත්පත්, සගරා. සමරු කලාප ආදිය වෙනුවෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් තුමා නිකුත් කරනු ලබන සුබ පැතුම් පණිවුඩ සැකසීම

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් නිර්මාණය කර ඇති වෙබ් අඩවිය යාවත් කාලීන කිරීම නව තොරතුරු ඇතුළත් කිරීම හා තොරතුරු නිකුත් කිරීම

### දිනපතා පුවත්පත් වාර්තා

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්ථා ,බුදු දහමට නිගරු කරන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා , අපහස, හා ශාසනික අර්බුධකාරී වාර්තා සම්බන්ධයෙන් දැනුවත් කිරීම ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කිරීම

# 08

# ගිණුම් අංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මුදල් අංශය කාර්යක්ෂම මූල්‍ය කළමණාකරණයක් පවත්වාගෙන යාම තුලින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් හා නිසි මග පෙන්වීමක් ලබා දෙමින් සියලුම අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු සහ අනිකුත් රජයේ ආයතන සමග බැඳුණු කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

<u>**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්**</u>

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂ වල ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සියලුම ලැබීම් ගෙවීම් සිදු කිරීම, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අග්‍රිම ලබා ගැනීම, මාසිකව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට වාර්තා සැපයීම, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමග දෙපාර්තමේන්තු පොත් සැසඳීම, වාර්ෂික ගිණුම් පියවීම.
- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු.
- ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ අධීක්ෂණය සහ පාලනය.
- විසර්ජන ගිණුම, රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම, පොදුතැම්පත් ගිණුම පිළියෙල කිරීම, විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ භාණ්ඩ සමීක්ෂණ හා අපහරණ කටයුතු සිදු කිරීම.
- සියලුම වත්කම් ලේඛන පවත්වාගෙන යාම.
- විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියලුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

| CATEGORY : APPROPRIATION ACCOUNT(2017) | | | | | | Form : A | |
|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs. In '000) | | | | | Physical Performance | |
| Description | Current Year | | Previous Year | Variations Over | Previous | Output(Service/Goods) | |
| | Budgeted | Actual | Actual | Budgetd | Year Actual | Type/class | Measure |
| **Programme Title and No** . 01 Operational Activities | | | | | | | |
| **Project Title and No**. : 01. General Administration & Establishment Services | | | | | | | |
| **Expenditure :** | | | | | | | |
| **Recurrent Expenditure** | | | | | | | |
| * Personal Emoluments | 34,480 | 31,830 | 30,294 | 2,650 | 1,536 | Personal Emoluments | No.of Employees |
| * Other Recurrent | 20,049 | 18,630 | 18,501 | 1,419 | 129 | | |
| Total | 54,529 | 50,460 | 48,795 | 4,069 | 1,665 | | |
| **Capital Expenditure** | | | | | | | |
| Rehabilitaion and Improvement of Capital Assets | | | | | | | |
| * Buildings & Structures | 300 | 300 | 298 | - | 2 | | |
| * Plant, Machinery and Eqiupments | 300 | 268 | - | 32 | 268 | | |
| * Vehicles | 800 | 602 | 338 | 198 | 264 | | |
| Acquisition of Capital Assests | | | | | | | |
| * Furniture and Office Equipments | 1,750 | 1,690 | 1,943 | 60 | (253) | | |
| * Plant, Machinery and Equipments | 800 | 793 | 257 | 7 | 536 | | |
| * Buildings & Structure | 8,000 | 8,000 | 4,500 | - | 3,500 | | |
| Capacity Building | | | | | | | |
| * Staff Training | 1,500 | 1,441 | 2,000 | 59 | (559) | | |
| Total | 13,450 | 13,094 | 9,336 | 356 | 3,758 | | |
| **Total Expenditure** | **67,979** | **63,554** | **58,131** | **4,425** | **5,423** | | |

**CATEGORY : APPROPRIATION ACCOUNT(2017)** **Form : A**

| Description | Financial Performance (Rs. In '000) Current Year Budgeted | Current Year Actual | Previous Year Actual | Variations Over Budgetd | Variations Over Previous Year Actual | Physical Performance Output(Service/Goods) Type/class | Measure |
|---|---|---|---|---|---|---|---|
| **Programme Title and No** . 02 Development Activities | | | | | | | |
| **Project Title and No**. : 02. Uflifment of Buddhist Activities | | | | | | | |
| **Expenditure :** | | | | | | | |
| **Recurrent Expenditure** | | | | | | | |
| * Personal Emoluments | 314,506 | 314,350 | 312,007 | 156 | 2,343 | Personal Emoluments | No.of Employees |
| * Other Recurrent | 919,625 | 748,739 | 741,353 | 170,886 | 7,386 | | |
| Total | 1,234,131 | 1,063,089 | 1,053,360 | 171,042 | 9,729 | | |
| **Capital Expenditure** | | | | | | | |
| * Facilitation of Dhamma School | 20,000 | 18,335 | 14,511 | 1,665 | 3,824 | | |
| * Facilitation of Sasanarakshaka Mandala | 3,000 | 2,908 | 2,940 | 92 | (32) | | |
| * Facilitation of SIlmatha Arama | 7,000 | 4,851 | 10,220 | 2,149 | (5,369) | | |
| * Dhamma School Teacher's Training & DhahamSarasaviya Programmer | 12,000 | 11,386 | 7,264 | 614 | 4,122 | | |
| Total | 42,000 | 37,480 | 34,935 | 4,520 | 2,545 | | |
| **Total Expenditure** | **1,276,131** | **1,100,569** | **1,088,295** | **175,562** | **12,274** | | |

| CATEGORY : ADVANCE ACCOUNTS (2017) | | | | | | | | Form : C | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs. In '000) | | | | | Physical Performance | | | | |
| | Rs. 000 | | | | | | | | | |
| Description | Current Year | | Previous Year | Variations Over | | Output(Service/Goods) | | Current Year's output | | Previous Years Output Actual |
| | Prescribed | Actual | Actual | Prescribed | Previous Year Actual | Type/class | Measure | Targeted | Actual | |
| **Type**: Advance Account | | | | | | Distress Loans | Applicant | | 20,875 | 18,668 |
| | | | | | | Property Loans | Applicant | | - | - |
| **Account Title and No.**: Public Officers Advance Account No 20101 | | | | | | Vehicle Loans | Applicant | | - | - |
| | | | | | | Indebt Loans | Applicant | | - | - |
| | | | | | | Bicycle Loans | Applicant | | - | - |
| Maximum Expenditure Limit | 34,000 | 30,671 | 24,354 | 3,329 | 6,317 | Festival Loans | Applicant | | 5,386 | 5,270 |
| Minimum Receipt Limit | 18,500 | 19,064 | 18,675 | 564 | 389 | Special Loans | Applicant | | 392 | 416 |
| Maximum Debit Limit | 68,000 | 58,475 | 46,868 | 9,525 | 11,607 | Special Loan Advances | Applicant | | 4,018 | - |
| Maximum Liability | | | | | | | | | | |

# 09

# අභ්‍යන්තර විගණන අංශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය සඳහා දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාම වෙනුවෙන්,1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත මඟින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමට සහය වීම මෙම අංශයෙන් සිදු කෙරේ.

2013/07/01 වන දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අභ්‍යාන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදි.

**අරමුණු-:**

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පවතින සියලුම විහාරස්ථාන හා දේවාල වල විගණන කටයුතු සිදුකිරීම.
- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සියලුම විගණන කටයුතු සිදුකිරීම.

- අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට සහය වීම.
- මනා ගිණුම් හා මූල්‍ය කළමනාකරණයකට සහය වීම.
- මනා සම්පත් භාවිතය තහවුරු කිරීමට සහය වීම.
- කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට සහය වීම.

අභ්‍යන්තර විගණනය වූ කලී සංවිධානයක් තුළ කෙරෙන ස්වාධීන තක්සේරුවකි. කළමනාකරණ ඒකකයේ සියළුම මට්ටම් වෙතින් ඉටුකරන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය කිරීම ද, මැන බැලීම ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ සිද්ධි දායක භාවය සම්බන්ධයෙන් වාර්තා කිරීම ද ඊට අයත් වේ. අභ්‍යන්තර විගණනය කළමනාකරණයට සහය වේ.

මෙම අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ.

## අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කෙරෙන සුවිශේෂී කාර්යභාරයන්

01.විහාර දේවාලගම් පනතේ විධිවිධාන අනුව සිද්ධස්ථානයක පවත්වාගෙන යා යුතු ගිණුම් පොත්පත් පිළිබඳ හඳුන්වා දී ඇති පාලන පද්ධති ශක්තිමත් කිරීම.

02. පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන පවතින සම්පත් භාවිතා කරමින් විගණනයට ලක්කිරීම සහ එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම.

03. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

04.දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා පූර්ණ දායකත්වය සහ සහයෝගය ලබා දීම.

05. දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ යුතු විශේෂ රාජකාරි සඳහා දායකත්වය ලබාදීම.

06. 2017 වර්ෂය තුළ සිදුකළ විගණන කටයුතු

## 2017 වර්ෂය

- සපරගමු මහා සමන් දේවාලය
- බදුල්ල පත්තිනි දේවාලය
- බදුල්ල කතරගම දේවාලය
- බෞද්ධ කටයුතු දෙපාර්තමේනතුවේ ගිණුම් විගණනය
- බදුල්ල සොරගුණේ කුඩා කතරගම දේවාලය
- රංගිරි දඹුලු රජමහා විහාරය
- සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය
- බෞද්ධ කටයුතු කොමසාරිස් නමින් පවතින 0002323279 දරණ ජංගම ගිණුම සම්බන් ධ විගණන වාර්තාව
- රංගිරි දඹුලු රජමහා විහාරයේ මහජන බැංකු ගිණුම් සම්බන්ධ වාර්තාව
- දෙව්නුවර පරම විචිත්‍රාරාමය රජමහා විහාරය
- දෙව්නුවර ශ්‍රී විෂ්ණු දේවාලය
- රුහුණු මහා කතරගම දේවාලය
- පොත්ගුල් රජමහා විහාරය
- පැල්මඩුල්ල රජමහා විහාරය
- ශ්‍රී පාදස්ථානය
- 2017 වවුචර් පරීක්ෂාව

- අභිනවාරාම විහාරය
- සෙල්ල කතරගම මහසෙන් විහාරය
- කිරිවෙහෙර රජමහා විහාරය
- 

අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන කටයුතු සිදුකෙරෙන විහාරස්ථාන සහ දේවාල පහත පරිදි වේ.

| කාර්යාලය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල | **එකතුව** |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 116 | 08 | **124** |
| රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය | 30 | 09 | **39** |
| මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට | 71 | 20 | **91** |
| **එකතුව** | **217** | **37** | **254** |

## ප්‍රධාන කාර්යාලය විසින්

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| කොළඹ | 08 | - |
| ගම්පහ | 14 | - |
| කළුතර | 07 | - |
| ගාල්ල | 07 | 01 |
| මාතර | 20 | 01 |
| කුරුණෑගල | 43 | 06 |
| හම්බන්තොට | 13 | - |
| අනුරාධපුර | 04 | - |
| **එකතුව** | **116** | **08** |

## රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අයත්

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| රත්නපුර | 16 | 04 |
| මොණරාගල | 09 | 02 |
| බදුල්ල | 05 | 03 |
| එකතුව | 30 | 09 |

## මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට අයත්

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| මහනුවර | 42 | 13 |
| මාතලේ | 07 | 01 |
| කෑගල්ල | 17 | 03 |
| නුවරඑළිය | 03 | 02 |
| බදුල්ල | 02 | 01 |
| **එකතුව** | **71** | **20** |

# 10

# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

## 10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය.

**පාලන බල ප්‍රදේශය**

රත්නපුර, මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්කවල 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ (4) 1 සහ (4) 2 වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4 (1) යටතේ පාලනය වන සිද්ධස්ථාන | 4 (2) යටතේ පාලනය වන සිද්ධස්ථාන |
|---|---|---|
| රත්නපුර | 20 | 536 |
| මොණරාගල | 11 | 362 |
| බදුල්ල | 08 | 390 |
| එකතුව | **39** | **1288** |

මෙම සිද්ධස්ථාන වලට අදාළ සියළු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධි විධානයන්ට අනුව රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. එම සේවාවන් අතර,

- විහාරස්ථාන සඳහා භාරකරුවන්, බස්නායක නිලමේවරුන් පත්කිරීමට සහය වීම.
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාර දීම.
- විහාර දේවාල සතු ඉඩම් බදු දීම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම,පරීක්ෂා කිරීම,මුදල් නිදහස් කිරීම
- විහාරස්ථාන සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීමට අදාළ කටයුතු කිරීම.
- රුහුණු මහා කතරගම දේවාලයේ පෙරහැර කටයුතු සඳහා සහය වීම.
- පඬුරු මුදල් සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
- ඉඩම් ගැටළු විසඳීම සඳහා සහය වීම.
- දැව හෙළීමට හා ප්‍රවාහනයට නිර්දේශ ලබා දීම.
- මැණික් බල පත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ බැංකු ගිණුම් සම්බන්ධව කටයුතු කිරීම.
- පැමිණිලි හා අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම ආදිය ප්‍රධාන තැනක් ගනී.

| අනු අංකය | රාජකාරි කටයුතු | දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|---|---|
| | | රත්නපුර | බදුල්ල | මොණරාගල | මුළු ගණන |
| **01** | භාරකරුවන් පත් කිරීම | 01 | 01 | - | 02 |
| **02** | ඉඩම් බදු දීම | 80 | 195 | 80 | 355 |
| **03** | බදු මුදල් සංශෝධනය | 40 | 450 | 40 | 530 |
| **04** | දැව හෙළීම හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම | 260 | 02 | 235 | 497 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **05** | අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු මුදල් නිදහස් කිරීම | 30 | 25 | 10 | 65 |
| **06** | පූජා ඔප්පු දීමට අනුමැතිය ලබා දීම | - | - | 02 | 02 |
| **07** | වන්දි මුදල් හා පොලී මුදල් නිදහස් කිරීම | 02 | - | 02 | 04 |
| **08** | විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටලු නිරාකරණය කිරීම | 90 | 70 | 80 | 240 |
| **09** | මැණික් ගැරීමට බලපත්‍ර ලබා දීම නිර්දේශ කිරීම | 137 | - | 06 | 143 |
| **10** | මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම | 150 | - | 03 | 153 |

සිද්ධස්ථාන සතු ගිණුම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා මෙම වර්ෂය තුළ භාරකරුවන් දැනුවත් කිරීම සිදු කෙරිණි. අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා කලට වේලාවට නොඑවන සහ ප්‍රමාද වී එවනු ලබන භාරකරුවන්ට හා බස්නායක නිලමේවරුන් දැනුවත් කිරීම ලිපි මඟින් සිදු කර ඇත. මෙම කාර්යාලය මඟින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මඟින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට පියවර ගෙන ඇත. බදු කරුවන් හා භාරකරුවන් සමඟ සාකච්ඡා කර බදු මුදල් අයකර ගැනීම සඳහා විශේෂ පියවරයන් රැසක් ගෙන ඇත. මෙහිදී සිද්ධස්ථානවල රාජකාරි ඉඩම් සම්බන්ධයෙන් සහ දේවාලවල කපු රාජකාරි ආරවුල් විසඳීමට කටයුතු කර ඇත. බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් සහ බදු මුදල් අභියාචනා ගැනද විශේෂ අවධානය යොමු කර කටයුතු කර ඇත.

ඒ අනුව රුහුණු මහා කතරගම දේවාලය මඟින් පැලවත්ත සීනි සමාගම වෙත බදු දී තිබූ ඉඩම් කොටස වෙනුවෙන් රු. එක් කෝටි හත් ලක්ෂ අසූ පන් දහස් එකසිය හැට තුනක් (රු.10785163.00) වාර්ෂික බදු ලබා ගෙන ඇත. වත්තේගම රජ මහා විහාරස්ථානයේ අක්කර 2138ක් ඇතිමලේ ප්ලාන්ටේෂන් ආයතනය වෙත බදු දී වාර්ෂික බදු මුදල රුපියල් ලක්ෂ හතලිස් හතක් අය කර දී ඇත. මීට අමතරව 2017 වර්ෂයේ වත්තේගම රජ මහ විහාරයට අයත් ඉඩම් විශාල ප්‍රමාණයක් වෙල්ලස්ස ඇග්‍රි එන්ටර්ප්‍රයිසස් පුද්. සමාගම (අක්.55) අයිකන් කොස්ටල් පුද්. සමාගම( අක්.100) හා මැලිබන් පුද්. සමාගම (අක්. 100) වෙත බදු දීමට කටයුතු කරමින් බවතී. ඒ තුළින් විහාරස්ථානයේ ආදායම් තත්වය ඉහළ නැංවීමට කටයුතු කරමින් පවතී. එසේම ඇඹිලිපිටිය කාවන්තිස්ස රජමහා විහාරය, රත්නපුර සුදර්මශාලා විහාරය වැනි සිද්ධස්ථාන සතු ඉඩම් බදු ලබාගැනීමකින් තොරව භුක්ති විඳි බහුතරයක් දීර්ඝකාලීන බදු කර වලට එළඹීමට පෙළඹීමක් 2017 වර්ෂයේ සිදු වී ඇත.

2017 වර්ෂයේ සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීම සම්බන්ධව හා බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇත.එමෙන්ම 2017 වර්ෂයේදී බදු ගෙවීම් ක්‍රමවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. එසේම කාර්යාලයේ කටයුතු පහසු කිරීමට හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට සිද්ධස්ථාන වල ක්‍රියාත්මක බදු සම්බන්ධ ලිපි ගොනු වෙන වෙනම පරිගණක ගත කිරීමේ වැඩසටහනක් 2016 වර්ෂයේ ආරම්භ කළ අතර එය තවදුරටත් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.

මෙම වර්ෂය තුළ සපරගමුව මහ සමන් දේවාලය,රුහුණු මහා කතරගම දේවාලය,කිරි වෙහෙර රජ මහා විහාරය ඇතුළු අනෙකුත් සිද්ධස්ථාන වල පඬුරු අධීක්ෂණ කටයුතු 35ක් පමණ සිදු කර ඇත.නිලධාරීන්ගේ නිවැරදි අධීක්ෂණය යටතේ පඬුරු මුදල් ගණනය කිරීම නිසා 2017වර්ෂයේ

| අනු අංක | සිද්ධස්ථානය | වාර්ෂික පඬුරු මුදල් |
|---|---|---|
| **01** | සබරගමු මහ සමන් දේවාලය | 13,494,906.00 |
| **02** | රුහුණු මහා කතරගම දේවාලය | 12,720,922.89 |
| **03** | කිරිවෙහෙර රජ මහා විහාරය | 34924,530.00 |
| **04** | අභිනවාරාම විහාරය | 307990.00 |
| **05** | සෙල්ල කතරගම මහසෙන් විහාරය | 1472900.00 |
| **06** | කොටබෝව කුඩා කතරගම දේවාලය | 296820.00 |
| **07** | උග්ගල් අළුත් නුවර කතරගම දේවාලය | 140154.18 |
| **08** | බොල්තුඹේ සමන් දේවාලය | 148797.00 |
| **09** | සංඛපාල රජ මහා විහාරය | 90305.00 |

පඩුරු මුදල් ලෙස රුපියල් හයකෝටි තිස්පන්ලක්ෂ අනූ හත්දහස් තුන්සිය හැට නවයයි සත දහඅට (රු. 63597369.18) දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

2017 වර්ෂයේ සපරගමු මහ සමන් දේවාලය,උග්ගල් අළුත් නුවර කතරගම දේවාලය,සංඛපාල රජ මහා විහාරය යන සිද්ධස්ථානවල සිදු කල කඩ බිම් වෙන්දේසි තුලින් රුපියල් හැත්තහතර ලක්ෂ එද්දාස් හත්සිය හැට එකයි සත විසි පහක් (රු. 7401761.25) උපයා දිමට මෙම කාර්යාලයේ නිලධාරීන් සමත් වී ඇත. සපරගමුව මහ සමන් දේවාලයේ පඩුරු ආදායමට අමතරව මැණික් ආදායම හා විදුලි ආධාර රිසිට්පත් ආදායම ගණනය කිරිම 2017 වර්ෂයේ සිට ආරම්භ කළ අතර විදුලි ආධාර ගිණුම වෙත ලැබෙන මුදල් වලින් සපරගමු සහ සමන් දේවාලයේ හිඟ ලෙස පවතින විදුලි බිල ගෙවා දැමීමය අදාල කටයුතු සිදුකරමින් පවතී. එසේම නිලධාරීන්ගේ නිවැරදි අධීක්ෂණය හා මඟලෙන්වීම යටතේ සපරගමු මහ සමන් දේවාලයට අයත් අංක SG KX 6551 දරණ නිල රථයේ වාරික මේ වන විට ගෙවා අවසන් කර ඇත.

## 10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය.

පාලන බල ප්‍රදේශය

මහනුවර,මාතලේ,කෑගල්ල,නුවරඑළිය දිස්ත්‍රික්ක හා බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය මහියංගන සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාලගම් ආඥා පණතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4 (1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4 (1) යටතේ පාලනය වන දේවාල | 4 (1) පාලනය නොවන සිද්ධස්ථාන |
|---|---|---|---|
| මහනුවර | 42 | 13 | 1023 |
| මාතලේ | 07 | 01 | 443 |
| කෑගල්ල | 17 | 03 | 740 |
| නුවරඑළිය | 03 | 02 | 317 |
| බදුල්ල | 02 | 01 | 497 |
| එකතුව | **71** | **20** | **3020** |

මෙම සිද්ධස්ථානවලට අදාළ සියලු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන අනුව මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර

- පාලනය වන විහාරස්ථාන සඳහා භාරකරුවන් පත්කිරීම
- ශ්‍රී දළදා මාලිගාව සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ බස්නායක නිළමේවරු පත්කිරීමේ ඡන්ද කටයුතු සිදු කිරීම.
- භාරකාර ඇප මුදල් තැන්පත් කිරීම හා නිදහස් කිරීම.
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාරදීම.
- විහාර දේවාල ඉඩම් බදු දීම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම, පරික්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම.
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී දළදා පෙරහැර, උප සම්පදා කටයුතු වලට සහාය වීම.
- දහම් පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගීවීම හා සහායවීම.
- ප්‍රවේණි අයිතිවාසිකම් පවරා ගැනීම පිළිබඳ ලේඛන පවත්වාගෙන යාම විශේෂයෙන් සිදු කෙරේ.

සිද්ධස්ථාන සතු ගිණුම් කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා 2016 වර්ෂයට සාපේක්ෂව මෙවරත් 2017 පෙබරවාරි මස 09 දින ශ්‍රී දළදා මාළිගාවේ රන් ආයුධ මණ්ඩපයේදී සිද්ධස්ථාන

භාරකරුවන් දැනුවත් කිරීමට සංවිධානය කළ සම්මන්ත්‍රණය වඩාත් ප්‍රතිඵලදායක විය. විශේෂයෙන්ම මෙකී වැඩමුළුවේ ප්‍රධාන අරමුණු වූයේ නෛතික කටයුතු ඇරඹීම සහ පවත්වා ගෙන යාම සහ සිද්ධස්ථාන වල ගිණුම් කටයුතු නියමිත ආකෘති පත්‍ර යොදා ගනිමින් නිසි ලෙස ගිණුම් තැබීම සඳහා පෙළඹවීමයි. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් ගිණුම් කටයුතු, විගණන සහ අධිකරණ කටයුතු ඇරඹීම සහ පවත්වා ගෙන යාම පිළිබඳ ප්‍රධාන දේශන 02 ක් පැවැත්විණි. එහිදී සිද්ධස්ථානවල පරිපාලන කටයුතු වල පැවැති අඩුපාඩු රැසක් මඟහරවා ගැනීම සඳහා ද මෙම රැස්වීම පිටුවහලක් විය. එසේම අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා නිසි කලට නොඑවන සහ ප්‍රමාද කිරීම් සිදු කරන භාරකරුවන්ට ලිපි මඟින් දැනුම් දීමට අමතරව සිද්ධස්ථාන වෙත ගොස් අයවැය වාර්තා නිසි කලට ලබා දීම සම්බන්ධව දැනුවත් කිරීම් ද සිදු කරන ලදි. එබැවින් 2017 වර්ෂයේ අනුමාන අයවැය වාර්තා ලැබීම් ප්‍රතිශතය 100% කි දක්වාද 2017 වර්ෂයේ අර්ධ වාර්ෂික අයවැය වාර්තා ලැබීම් ගත් කල පළමු මාස 06 තුළ වාර්තා 84 ක් ද දෙවන මාස 06 තුළ වාර්තා 66 දක්වා ද වර්ධනය කර ගැනීමට හැකි විය.

එකිනෙක සිද්ධස්ථාන සඳහා වෙන්වෙන් වශයෙන් බදු සම්බන්ධ වෙන වෙනම ලේඛන සකස් කොට පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙල පෙර වර්ෂ වල මෙන්ම මෙම වර්ෂයේ දී ද සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යන අතර වසර පහෙන් පහට බදු මුදල් සංශෝධනය කිරීම සම්බන්ධව ලිපි ගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙන බැව්ද සඳහන් කරමි. මීට අමතරව අදාල දිස්ත්‍රික්ක වල සියළුම සිද්ධස්ථාන වල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබා ගැනීම සහ එම තොරතුරු පරිගණක ගත කිරීමේ වැඩ පිළිවෙල ද පෙර වර්ෂ වල මෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම රාජකාරී ඉඩම් පිළිබඳව ක්‍රියාකල යුතු ආකාරය පැහැදිලි කර දීම හේතුවෙන් එකී ඉඩම් පැවරීම් කිරීමේදී නියමිත දැන්වීම නිසි පරිදි සම්පූර්ණ කර එවීම නිසා රාජකාරී ඉඩම් ලේඛන පවත්වාගෙන යාමේ වැඩ පිළිවෙලක් දැනට සකස් කරගෙන යාමට හැකි වී ඇති බැව් ද සඳහන් කරමි.

එසේම මෙම වර්ෂය තුල දී සිද්ධස්ථාන වලට අයත් ඉඩම් ගැටළු හා බදු ඔප්පු සකස් කිරීමේ දී සහ ලියාපදිංචි කිරීමේ දී පවතින ගැටළු සම්බන්ධව සාකච්ඡාවක් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ සහභාගීත්වයෙන් නීතිඥවරුන් සහ නොතාරිස්වරුන් සම්බන්ධ කර ගනිමින් 2017.11.09 දින මහනුවර රෝයල් මෝල් ශාලාවේදී පවත්වන ලදි.

ඒ අනුව පසුගිය වර්ෂයේ ලද අත්දැකීම් තුලින් ප්‍රධාන කාර්යාලයේ මඟ පෙන්වීම ද උපයෝගී කර ගනිමින් කාර්යාල පරිසරය සුදුසු ලෙස නිර්මාණය කිරීම තුළින් හොඳ වැඩ පරිසරයක් කාර්යාල නිලධාරීන්ට ලබා දී පෙර වර්ෂ වලදී මඟහැරුණු වැඩ කොටස්, අඩුපාඩු සකස් කරගෙන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී සේවාවක් සේවාලාභීන්ට සැපයීමට 2018 වර්ෂයේ දී ද සියළු දෙනාගේ සහයෝගයෙන් කැපවෙන බවට වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

**ඇමුණුම් අංක 01**

| | | |
|---|---|---|
| 01. නිකුත් කර ඇති බදු අයදුම්පත් සංඛ්‍යාව | - | 1476 |
| 02. අවසන් කර ඇති බදු ඔප්පු | - | 311 |
| 03. තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන | - | 165 |
| 04. ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන | - | 65 |
| 05. කාර්යාල පරීක්ෂණ ගණන | - | 59 |
| 06. විහාරාධිපති තහවුරු කිරීම් ලිපි | - | 02 |
| 07. භාරකරුවන් පත් කිරීමේ ලිපි | - | 12 |

08. බස්නායක නිලමේවරුන් පත්කිරීමේ ලිපි - 02
09. භාණ්ඩ භාර දීම් - 05
10. මුදල් නිදහස් කල සංඛ්‍යාව - 39
11. ගස් කැපීම් - 171
12. ශ්‍රමදාන - 04
13. පඬුරු මුදල් රාජකාරී අවස්ථා - 114
14. විභාගවෙමින් පවතින නඩු - 06
15. 2017 වර්ෂයේ අවසන් වූ නඩු - 02

**ඇමුණුම් අංක 02**

| අනු අංකය | සිද්ධස්ථානය | වාර ගණන | වර්ෂය තුළ මුදල් එකතුව |
|---|---|---|---|
| 01 | ශ්‍රී දළදා මාළිගාව | 58 | 31,599,150.00 |
| 02 | මහනුවර විෂ්ණු දේවාලය | 05 | 1,008,710.00 |
| 03 | අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලය | 04 | 3,666,295.00 |
| 04 | මහනුවර කතරගම දේවාලය | 12 | 3,054,155.00 |
| 05 | මහනුවර පත්තිනි දේවාලය | 09 | 2,513,221.00 |
| 06 | දොඩන්වල නාථ දේවාලය | 06 | 642,605.00 |
| 07 | අම්බැක්ක කතරගම දේවාලය | 02 | 235,974.00 |
| 08 | මහනුවර නාථ දේවාලය | 01 | 460,590.00 |
| 09 | රංගිරි දඹුළු රජමහා විහාරය | 02 | 2,929,915.00 |
| 10 | ගැටඹේ රාජෝපවනාරාමය | 11 | 4,893,017.00 |
| 11 | මුතියංගණ රජමහා විහාරය | 01 | 490,000.00 |
| 12 | මහියංගණ සමන් දේවාලය | 03 | 2,516,610.00 |
| 13 | මහියංගණ රජමහා විහාරය | 02 | 658,626.00 |
| 14 | ලංකාතිලක විෂ්ණු දේවාලය | 01 | 219,055.00 |
| 15 | හඟුරන්කෙත විෂ්ණු දේවාලය | 01 | 346,337.00 |
| 16 | මැදගොඩ පත්තිනි දේවාලය | 01 | 170,558.00 |
| | **එකතුව** | **119** | **55,404,818.00** |

**2017 වර්ෂය තුළ සිද්ධස්ථානවල පඬුරු මුදල් ඉවත් කිරීම සඳහා**
**සහභාගී වූ වාර ගණන සහ වර්ෂය තුල ලැබුණු ආදායම**

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථානය |
|---|---|---|---|
| 01 | DLM 000982/11 | මහනුවර දිසා අධිකරණය | සුදුහුම්පොල රජමහා විහාරය |
| 02 | 20381/L | මහනුවර දිසා අධිකරණය | දලුක්ගොල්ල රජමහා විහාරය |
| 03 | L 21455 | මහනුවර දිසා අධිකරණය | ගංගාරාම රජමහා විහාරය |
| 04 | DLM 1306/12 | මහනුවර දිසා අධිකරණය | ත්‍රී සිංහල සීමාරාමය |
| 05 | DLM 00048/14 | මහනුවර දිසා අධිකරණය | අලවතුගොඩ සඳගිරි විහාරය |
| 06 | X 212 | හැටන් දිසා අධිකරණය | ශ්‍රී මෙත්තාරාම විහාරය |

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථානය |
|---|---|---|---|
| 01 | L/5377 | මාතලේ දිසා අධිකරණය | පිදුරංගල රජමහා විහාරය |
| 02 | L/1773 | මහනුවර දිසා අධිකරණය | අමුනේවෙල රජමහා විහාරය |

**2017 අවසන් වූ නඩු**

| වර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| බදු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 350 | 650 | 880 | 1177 | 1476 |
| බදු ඔප්පු සංඛ්‍යාව | 248 | 216 | 275 | 369 | 311 |




2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා බදු ඉල්ලුම්පත් හා බදු ඔප්පු සංඛ්‍යාවේ ප්‍රගතිය

| වර්ෂය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| පඩුරු මුදල් ආදායම | 38,808,964.00 | 52,297,383.00 | 55,404,818.00 |
| වර්ෂය තුළ අළුතින් එකතු වූ බදු මුදල් ආදායම (වාර්ෂික) | 3,673,680.00 | 11,861,280.00 | 12,377,544.00 |
| බදු ගත් අක්කර ප්‍රමාණය | - | 122 | 138 |
| රාජකාරී ආඥා පත් එවීම | - | 05 | 44 |

2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පඬුරු මුදල් ආදායම සහ වාර්ෂික බදු මුදල් ආදායම ප්‍රගතිය

